# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,490 — 1965 අගෝස්තු 27 වැනි සිකුරාද — 1965.8.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1125 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1166 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1133 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1141 | රට බීම විකිණීමේ බල්පත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1162 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1164 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

### විශෙෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(ඇ) අයදුම්කරුවන් ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3 ක්.

(සැලකිය යුතුයි: දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනා ය.)

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කර වනු ලැබේ.

එස්. එල්. ද සිල්වා,
වැ. බ. අධ්‍යක්ෂ.

1965 අගෝස්තු 18 වෙනි දින,
රත්මලානේ,
කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ දී.

## ආදර්ශ ආකෘති පත්‍රය

**කා. අ. හා. පු. දෙ. ලී වැඩ පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතු යි. අයදුම්කරු ලංකාවේ නො උපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතු ය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසු කම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතු යි)

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේ ද? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම :————.
(ඒවායේ පිටපත් ඇමිනිය යුතු යි).

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුනු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පුවුව හොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වී මෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පුවුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව ද හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-891—65.8.27 දින අංක 14,490 දරණ ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව කර්මාන්ත සහකාර තනතුරු (තාවකාලික)

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සහකාර තනතුරු (තාවකාලික) සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘතියේ ප්‍රකාර සකස් කරන ලද ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර 16 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප්.**—මෙම තනතුරුවලට අයත්වන්නේ වාර්ෂිකව රු. 3,180 න් පටන් ගෙන රු. 120 වාර්ෂික වේතනාධික හයකින් ද, රු. 180 වාර්ෂික වේතනාධික අටකින් සහ රු. 240 වාර්ෂික වේතනාධික හයකින් ද වැඩිවී රු. 6,780 දක්වා නගින වැටුප් ක්‍රමයකි. රු. 4,080, රු. 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුරු තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත කර්මාන්ත සහකාර තනතුරුවල ඇබෑර්තු ඇතිවුවහොත්, එසේ ඇබෑර්තු ඇතිවූ විට, තෝරා ගත් අයදුම්කරුවන් එම ඇබෑර්තු පිරවීම සඳහා උසස් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

4. **සේවා කොන්දේසි.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට තුන් අවුරුද්දක් ඇතුළත දී (i) ගණන් සහ (ii) පාලන ව්‍යවස්ථා හා රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග අතින් පරීක්ෂණයකින් සමත්වීමට අවශ්‍ය වනු ඇත. පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීමට පෙර දෙමල භාෂාමය පරීක්ෂණයකින් සමත්වීමට ද ඔවුන්ට නියම් කෙරෙනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම, නම්:—

(අ) **1965 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 30 ට නො වැඩි වීමට ද;**

(ආ) **පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු** (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ස්වභාව විද්‍යාව හෝ ශිල්ප කර්මාන්ත විද්‍යාව යන විෂයයන් අතින් උපාධි ලබා ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ) ; හෝ

(ඉ) පිළිගත් ආයතනයකින්, ශිල්ප කර්මාන්ත විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව අතින් උපාධියක් ලබා ඇති බවට ද;

(ඊ) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බවට ද සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—ගෘහ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත අතින් ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී, ප්‍රමාදය ගැන ප්‍රමාණ වත් හේතූන් දක්වා එම ඉල්ලුම් පත්‍ර පිළිගන්නා ලෙස ඉල්ලමින් ඉදිරිපත්කළොත් මිස, නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු නො ලැබේ.

7. ඉල්ලුම් කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතිකය බාර ගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඉ) **ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරුවලට** පත්වීම් ලැබීමට ඇති යෝග්‍යතාවය ගැන ලඟදී ලබාගත් සහතික තුනක් (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කිරීම් අනවශ්‍ය ය).

**සටහන.**—මෙම සහතික පිටපත් ආපසු එවනු නො ලැබේ.

8. ඉල්ලුම් පත්‍ර සහ ඊට අදාල වෙනත් ලිපි ආදිය ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට මිස, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ පුද්ගලික නමට ඉදිරිපත් නොකළ යුතු ය.

9. **රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ** මුල් කොටසේ පලවී ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් දීමේ දී අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක

1965 අගෝස්තු 26,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

**කර්මාන්ත සහකාර තනතුර (තාවකාලික) ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
   (අගට යෙදෙන නම පළමුව)
2. තැපැල් ලිපිනය :————.
3. පුරවැසි බව හා එය ලබාගත්තේ කෙසේද යන වග :————.
4. (අ) උපන් දිනය සහ 1965 සැප්තැම්බර් 16 දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතු ය)
   (ආ) විවාහකද,අවිවාහකද, යන වග :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඉ) ඔහුගේ පියාගේ පියා :————.
   (ඊ) ඔහුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා :————.
6. **අධ්‍යාපන සුදුසුකම්.**—ලබාගත් දිනයන්ද අත්කරගත් පන්තියද (පන්තියක් තිබේ නම්) හා හදාරන ලද විෂයයන් ද සඳහන් කළ යුතු ය. (ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පිටපත් ඇමිණිය යුතු ය.) :————.
7. ලබා ඇති කාර්මික සුදුසුකම් :————.
8. අධ්‍යාපනය ලැබූ ස්ථානය සහ පාසලින් අස්වූ දිනය :————.
9. පාසලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ දා සිට රැකියාවල් කළා නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
10. සිංහල සහ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීම පිළිබඳ ප්‍රවීණතාවය :————.
11. ගෘහ කර්මාන්ත සහ කුඩා කමර්ාන්ත පිළිබඳ යම්කිසි පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
12. චරිත සහතික ලබාගත් අයවලුන්ගේ නම් සහ ලිපිනයන් :————.
13. ඉල්ලුම්කරු පෞද්ගලිකව හඳුනන තැනැත්තන් දෙදෙනෙකුගේ නම් සහ තනතුරු :————.
14. විශේෂ සුදුසුකම් ආදිය ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මම මෙයින් සනාථ කරමි. මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරුනු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත්, මෙම තනතුරට පත්වීමට මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි අසත්‍යතාවයක් හෝ වැරුද්දක් හෙළිවුවහොත් කිසිම වන්දියක් නො ලබා මා සේවයෙන් පහ කරනු ලැබීමට හැකි බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙතට යි.

8–855—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වැල්ලවාය නානායම් භාරකාර තනතුර

වැල්ලවාය නානායම් භාරකාර තනතුර සඳහා ඉල්ලුම්පත් එවන මෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කළ ඉල්ලුම්පත් 1965 සැප්තැම්බර් මස 8 වැනි දින දාවල් 12 ට හෝ ඊට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුරට අදාළ වැටුප් ක්‍රමය නම් :—රු. 540—12—22—රු. 804 යි. (රු. 636 ට සහ රු. 732 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත)

3. ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර වයස අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අවුරුදු 3 ට නොඅඩු කාල සීමාවක් ආහාර පිසීමේ සහ අ හාර පාන සැපයීමේ පළපුරුදුකම් ඇති ආණ්ඩුවේ සේවකයින්ට උපරිම වයස් සීමාව නොයෙදේ.

4. ඉල්ලුම්කරුවන්ට කෑම පිසීම සම්බන්ධව මනා දැනීමක් තිබිය යුතු අතර ගණන් තැබීමටද පුළුවන් විය යුතුය. ආහ ර පාන සැපයීමේ ව්‍යාපාරවල පළපුරුදුකම් ලබා ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. සේවා කොන්දේසි :—

(i) තෝරාගනු ලැබූ අයදුම්කරු අවුරුදු 3 ක ප්‍රවාසනයට යටත්වේ. විශේෂ අවස්ථාවලදී හැර යම් පාලන දිස්ත්‍රික්කයන් සඳහා බඳවාගත් අයදුම්කරු එම දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු කිරීම් කරනු නොලැබේ.

(ii) පුළුවන් අවස්ථාවලදී ගෙවල් කුලීවලින් තොර නැවතීම් පහසුකම් සලස්වා දෙනු ලැබේ.

(iii) බඳවාගනු ලැබූ අයදුම්කරු ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමටත් විශෙෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතුවට පන වනු ලබන ව්‍යවස්ථාවලටද අනුව ක්‍රියා කළ යුතුය.

(iv) පත් කිරීම සඳහා රජයේ සේවයෙහි සිටින ස්ථිර නිලධාරීනු තෝරා ගනු ලැබුව හොත් වැඩ බැලීමේ පදනම උඩ ඔහු පත් කරනු ලැබේ.

7. තෝරාගත් අයදුම්කරු තමා භාරයට පත් කරනු ලබන ලද නානායම් ලී බඩු සහ වෙනත් බඩුබාහිරාදිය ආරක්ෂා සහිතව තබා ගැනීමේ හා තම රාජකාරිය විශ්වසවන්තව ඉටු කිරීමේ පොරොන්දුවක් වශයෙන් දැනට මුදලින් රු. 1000ක් ඇප තැබිය යුතු අතර, ගිවිසුම්නටද අත්සන් කළ යුතුය.

8. තෝරාගත් අයදුම්කරු දැනටමත් රජයේ සේවයේ නියුතු අයෙකු නොවේ නම්, දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම සඳහා තමා කායික වශයෙන් සුදුසුදැයි තීරණය කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

9. අයදුම්කරු අවශ්‍ය වුවහොත් මොණරාගල දිසාපති කාර්යාලයේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් සඳහා තමාගේ වියදමින් පැමිණ පෙනී සිටිය යුතුය.

10. ඉල්ලුම්පත් මොණරගල රජයේ දිසාපති නමට එවිය යුතු අතර, පුද්ගලිකව පහත අත්සන් කළ අය නමට නොඑවිය යුතුය.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IT) ඡේදයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන සේවා තනතුරු සඳහා පත්වීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

ඇම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1965.8.20 වෙනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදී.

**වැල්ලවාය නානායම් භාරකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ෆෝර්මය**

1. නිවේදනය පිළිබඳ යොමුව :————.
2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් ලිවිය යුතුය) :————.
3. ජාතිය :————.
4. ඉල්ලුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
5. ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ස්ථානය :————.
6. විවාහක ද, අවිවාහකද යන වග :————.
7. අධ්‍යාපනික සුදුසුකම් හා අවසාන වරට සමත් වූ විභාගය දින යත් සමග :————.
   (අ) සිංහල/දෙමළ :————.
   (ආ) ඉංග්‍රීසි :————.
8. ඉගෙනගත් පාසල සහ ඉන් අස්වූ දිනය :————.
9. සම්පූර්ණ ලිපිනය :————.
10. (අ) පාසලින් අස්වූ දින පටන් කල රැකියාවල් (කාලපරිච්ඡේද යත් සමග සම්පූර්ණ විස්තර දිය යුතුය) :————.
    (ආ) කලින් රජයේ නියුක්තව සිටියේ නම් අස්වීමට හේතු සමග සම්පූර්ණ විස්තර දිය යුතුය :————.
11. කියවීම, ලිවීම හා අර්ථ නිරූපනය පිළිබඳ ප්‍රවීනතාවය :
    සිංහල :————.
    දෙමළ :————.
    ඉංග්‍රීසි :————.
12. විශෙෂ සුදුසුකම් පිළිබඳ විස්තර (එනම් කෑම පිසීම, ගණන් තැබීම ආදියෙහි පලපුරුද්ද) :————.
13. චරිත සහතික ලබ ගත් අයවලුන්ගේ නම් සහ පදවි (එම සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.
14. ක්‍රිමිනල් වරදක් සඳහා දඬුවම් ලබා තිබේද? එසේ නම් දිනය, නඩුවේ අංකය, සහ වරදේ ස්වභාවය සඳහන් කළ යුතුය : ————.
15. ණයතුරුස්වලින් හා මුදල් පිළිබඳ කරදර වලින් නිදහස් ද? :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති වෙතටයි,
දිසාපති කාර්යාලය,
මොණරාගල.

8–933—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### වාණිජ ගුරුවරුන් බඳවා ගැනීම

සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් උගන්වන පාසැල්වල වාණිජ ගුරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කර 1965 සැප්තැම්බර් 11 වැනි දින හෝ ඊට පෙර, අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ (වාණිජ්‍ය ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයෙහි මුදුනේ වම් කෙළවරේ" වාණිජ ගුරු තනතුරු ඉල්ලුම් පත්‍රය" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය. සිංහල මාධ්‍යයෙන් ඇබෑර්තු 27 ක් සහ දෙමළ මාධ්‍යයෙන් ඇබෑර්තු 5ක් ද ඇත.

2. වැටුප් හා දීමනා.—මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 1,560—14×72—රු. 2,568 (කාර්යක්ෂමතා කඩඉම) රු. 2,640—5 × 120— රු. 3,240 කි. නියමිත ප්‍රමාණයන්ට අනුව, ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවනාධාර දීමනාව ගෙවනු ලැබේ.

3. සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි.—(1) මෙම තනතුරු ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීමක් ලබන්නෙකු අවුරුදු තුනක ආධුනිකත්ව කාලයකට යටත් වේ.

(3) තෝරාගනු ලබන අයදුම්කරුවෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කළයුතුය.

4. වයස් සීමාව.—ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුයි. උපරිම වයස් සීමාව දැනට රජයේ පාසැල්වල සේවයේ සිටින ස්ථිර ගුරු භවතුන්ට හා රජයේ අනිකුත් ස්ථිර සේවකයන් කෙරෙහි බලපාන්නේ නැත.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමාට පහත සඳහන් සුදුසුකම් ගිමි බව සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) (1) ලංකාවේ කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හෝ ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් ආයතනයේ උසස් පෙළ වාණිජ සහතික පත්‍ර දෙක, හෝ

(2) කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හෝ ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් ආයතනයේ උසස් පෙළ වාණිජ සහතික පත්‍ර එකක් හා අනෙක් අංශයේ පහළ පෙළ වාණිජ සහතික පත්‍රය, හෝ

(3) සිංහල භාෂාමය වාණිජ සහතිකයේ කොටස් දෙකම.

(ආ) සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් ජ්‍යෙෂ්ඨ හෝ අ. පො. ස. (සා. පෙ.) විභාගයේ සාමාර්ථ්‍යය,

(ඇ) විශිෂ්ට චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් යලිවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කටයුතු සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතිකය හෝ භාරගනු නොලැබේ.)

(ආ) සුදුසුකම් සහතික පත්‍ර;

(ඇ) සිංහල/දෙමළ පිළිබඳව ලබා ඇති තත්ත්වය දක්වෙන සහතිකය;

(ඈ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මෙම තනතුරට පත්වීම ලැබීමට ඔහුගේ/ඇගේ ඇති යෝග්‍යතාව පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක්.

(දැනට රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම උප ඡේදය යටතේ නියමිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

සංලක්ෂ්‍යය.—මෙම චරිත සහතික පිටපත් හෝ සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ වන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුය. මෙම නිවේදනයෙහි සඳහන් කොන්දේසිවලට අමතර වශයෙන් එම කොන්දේසි ද බලපානු ඇත.

8. අයදුම්කරුවන් විසින් මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය පිටපත් කර ගත යුතුයි. මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම ලබා ගැනීමට නොමැත. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. තම තමාගේ ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

#### වාණිජ ගුරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
මහත්මයා/මහත්මිය/මෙනෙවිය (පැහැදිළි අකුරෙන්)

2. ලිපිනය :————.

3. අයදුම්කරුගේ උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි)

4. උපන් ස්ථානය :————

(අ) අයදුම්කරුගේ පියා :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. (අ) ජාතිය :————.

(ආ) ලාංකිකයෙක් නම් ලියාපදිංචි වීමෙන්ද නැතහොත් උත්පත්තියෙන්ද යන බව :————.

6. දැනට රක්ෂාවක් තිබේ නම් එය, සේවා සටහන් විස්තර සහිතව :————.

7. සුදුසුකම් :————.

8. සිංහල/දෙමළ දැනුම :————.
සමත්වූ උසස්ම විභාගය :————.

9. විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

10. චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

11. ඉහත සඳහන් තනතුර සඳහා තෝරාගනු ලැබී නම් :
(සම්පූර්ණ නම) වන මම දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට එකඟවෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-1048—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සේවාවේ I වෙනි ශ්‍රේණියේ පිරිවැය ගණකාධිකාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන මෙන් ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. පඩි ක්‍රමය.—මසකට (සියළු දීමනාවන් ඇතුළුව) රු. 1,000—රු. 40×5 හා රු. 50×6—රු. 1,500 දක්වා; රු. 1,250 දී කාර්යක්ෂමතා කඩඉම් සහිතව. (තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැක.)

3. සුදුසුකම්.—අපේක්ෂකයින්—

1. 1965.8.1 වෙනි දා වන විට වයස අවුරුදු 45ට අඩු විය යුතුය. (රාජ්‍ය සේවාවය, පළාත් පාලන සේවාවය, රජයේ සංයුක්ත මණ්ඩලීය සේවාවය යන මේ සේවාවන්ට අයත් හා මෙම මණ්ඩලයේ සේවකයන්ට මෙය අදාළ නොවේ.)

2. මිල හා කර්මාන්ත ගණකාධිවරුන්ගේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී විධායක තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු 2ක පළපුරුද්දක් තිබිය යුතුය.

3. සිංහල පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනවා ඇත.

**සැ. යු.**—විශාල නිෂ්පාදන ආයතනයක හෝ ඉංජිනේරු ආයතනයක හෝ ප්‍රවාහණ ආයතනයක හෝ කටයුතු කර පළපුරුද්දක් ඇති අපේක්ෂකයින්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. (ඒ) රාජ්‍ය සේවාවෙහි හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඔවුන් දැන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට ඔවුන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. නැතහොත් ඒ නිලධාරීන් ඔවුන් දැන් සිටින සේවාවෙන් හෝ පළාත්පාලන සේවාවෙන් ඉල්ලා අස්වීමට කැමති වෙතොත් පමණකි.

රාජ්‍ය සේවාවේ පළාත් පාලන සේවාවේ සිටින නිලධාරීන් තෝරා ගනු ලැබුවහොත් 1 වෙනි වතාවට ඔවුහු එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා ද්විතීයනාය පිට පත් කළ හැකිය. එසේ පත්කළ හොත් ඔවුන්ගේ පඩිය හා සෙසු පත්කිරීම් කොන්දේසි භාණ්ඩාගාර යෙන් තීරණය කරන පරිදි වන්නේ ය.

(බී) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තේරුණොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි.**—තේරුන අපේක්ෂකයා 1 වෙනි වතාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔහුට පහත පෙනෙන දේ කිරීමට නියම කරනු ලැබේ :—

1. පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ වීම,
2. දැනටමත් පනවා ඇත්තාවූද කලින්කල පනවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම.
3. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබා ගැනීම.
4. මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10ක් දායක මුදල් ගෙවීම. ඔහු වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල් සියයට 15 කි.
5. ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාසයෙහිත් සේවය කිරීම.

6. ඉල්ලුම් පත්‍ර, මේ නිවේදනයට පහත දක්වා ඇති ආකෘතිය අනුව ලියා කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාරතැන වෙත 1965 සැප්තැම්බර් මස 11 වෙනි දා වන සෙනසුරාදා හෝ ඊට කලින් ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාරතැන.

1965 අගෝස්තු මස 17 වෙනි දින,
කොළඹ, කිරුළ පාරේ,
අංක 200 වෙනි ස්ථානයේදීය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### අයදුම් පතෙහි ආදර්ශ ආකෘතිය

1. ඉල්ලන තනතුර :————.
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
3. තැපැල් ලිපිනය :————.
4. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.) :————.
5. 1965. 8. 1 වෙනිදාට වයස අවුරුදු :————, මාස :————, දවස් :————.
6. අයදුම්කරු ලාංකිකත්වය ලැබුවේ පරම්පරාවෙන් ද, ලියාපදිංචි කරවා ගැනීමෙන් ද යන වග :————.
7. අයදුම්කරු විවාහකද අවිවාහකද යන වග (විවාහ වූ දිනයද දරුවන් ගණනද ඔවුන්ගේ වයස් ප්‍රමාණයන් ද සඳහන් කළ යුතුයි.) :————
8. සාමාන්‍ය අධ්‍යයනය (සාමාන්‍ය අධ්‍යයනය ලැබූ පාඨශාලා හා සමර්ථ වූ දිනයන් ද සමග සඳහන් කළ යුතුයි.) :————.
9. උසස් අධ්‍යයනය (උසස් අධ්‍යයනය ලැබූ ආයතන පිළිබඳ සම්පූර්ණ විස්තරද, සමත් වූ විභාගයද, වෘත්තීය සුදුසුකම්ද දිනයන් සමග සඳහන් කළ යුතුයි. එවිය යුත්තේ සහතික පත්‍රවල පිටපත් පමණකි.):————.
10. අයදුම්කරු කළ රක්ෂා :————. (පාසැලෙන් අස්වීමෙන් පසු කළ රක්ෂා පිළිබඳ සම්පූර්ණ විස්තර ඉදිරිපත් කළ යුතුයි. රක්ෂාව කළ ස්ථානයන් ද, දැරූ තනතුරුවල නම්ද, ඒ තනතුරු ලැබූ දිනයන් ද ඒවායින් අස්වූ දිනයන් ද, අස්වීමට හේතුන්ද එකී විස්තරවලට අඩංගු විය යුතුය.) :————.
11. කිසියම් වෘත්තියක් සම්බන්ධයෙන් අයදුම්කරුට හිමි පළපුරුද්ද හෝ රාජ්‍ය සේවය, පළාත් පාලන සේවය, වෙළඳ ආයතන යන මේවායේ විධායක තනතුරුවල සිට ලබා ඇති පළපුරුද්ද හෝ ඒ පිළිබඳ විස්තර (දැරූ තනතුරුවල නම්ද, කළ කර්තව්‍යවල ස්වභාවයද සියලු දීමනාවන් සහිත පඩිද දිනයන් ද සමග සඳහන් කළ යුතුය :————.
12. ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුට හිමි විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර (පූර්වෝක්ත කිසියම් තනතුරක් දරමින් සිටි කාලයේදී ඔබ කළ වැඩ දැන් ඉල්ලා සිටින තනතුර ලැබීමට විශේෂ සුදුසුකම් වශයෙන් දැක්විය හැකි නම් ඒ පිළිබඳ විස්තර) :————.
13. සිංහලය පිළිබඳ ලබා තිබෙන ප්‍රවීණත්වය :————.
14. වෙනත් තොරතුරු :————.
15. අයදුම්කරු මීට පෙර ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළේ ද, එසේ නම් ඊට කුමක් වූයේ ද යන වග :————.
16. අයදුම්කරු උසාවියක් මගින් ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධ යෙන් වරදකරුවෙකු යයි නිශ්චය කර තිබේද යන වග. එසේ කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කළ යුතුයි :————.
17. අයදුම්කරු පිළිබඳ තොරතුරු අසා දැනගත හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :—
    1. :————.
    2. :————.

මේ අයදුම් පතෙහි මා සඳහන් කර තිබෙන විස්තර නිවැරදි බවද, සත්‍ය බවද, මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව ඔප්පු වුවහොත්, එසේ ඔප්පු වූයේ මා තනතුරට තෝරාගැනීමට ප්‍රථම යෙන් නම් ඒ කරණකොටගෙන මා නුසුදුසු කෙනෙකු වන බවත්, තෝරාගැනීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නො ගෙවා මා පහකර දමනු ලැබීමට හේතුවන බවත් මම දන්නා බව මෙයින් ප්‍රකාශ කරමි.

————,
දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

8–1013—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## 1965 ඔක්තෝබර් මාසයේදී ආරම්භ වන අධ්‍යයන වාරය සඳහා කොළඹ, රජයේ භෝජනාගාර පාසැලේ අභ්‍යාස පාඨමාලාව

පහත සඳහන් කාර්‍යයන් විශේෂකොට ඇතිව භෝජනාගාර සේවය පුහුණු කිරීම සඳහා කොළඹ, රජයේ භෝජනාගාර පාසැලෙහි පැවැත් වෙන එක් අවුරුදු පාඨමාලාව සඳහා ඇති පුරප්පාඩු 40ක් පිරවීමට, සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :—

1. ආහාර සවාසථ්‍යය.
2. නිදන කාමර කටයුතු.
3. කෑම කාමර කටයුතු.
4. මුළුතැන් ගෙය හා ආහාර පිසීම.

2. ඉල්ලුම්කරුවන් 1965 සැප්තැම්බර් මස 17 වැනිදට අවුරුදු 18ටත් 25ටත් අතර වියයුතු අතර, යටත් පිරිසෙයින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ විෂයයන් හයකින් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්විය යුතුයි. ආධුනිකයන්හට විදේශීන් සමග ගනුදෙනු කිරීමට සිදුවන හෙයින් ඉංග්‍රීසි භාෂාව හෝ වෙනත් විදේශීය භාෂාවක් ද දැනගෙන සිටීම වැඩිමනත් සුදුසුකමක් ලෙස සලකනවා ඇත.

3. මණ්ඩලයක් මගින් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකින් අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

4. තෝරාගනු ලබන ශිෂ්‍යයින්ට නොමිලේ අධ්‍යාපනය හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ඇත. ශිෂ්‍යයින් පාසැලෙහි නතර විය යුතු අතර කෑම සහ නවාතැන් ගාස්තු වශයෙන් මාසයකට රු. 50ක් ගෙවිය

යුතුය. මෙම පාඨමාලාව සඳහා ඇතුලත් කරගනු ලබන්නේ පිරිමි ශිෂ්‍යයින් පමණකි.

5. තෝරාගනු ලබන ශිෂ්‍යයින්ට අභ්‍යන්තර සේවා පුහුණුවක් ලබා දෙන අතර ඒ සඳහා කිසිම දීමනාවක් නොදෙනු ඇත. අනුමත කළ මෝස්තරයෙන් හා රෙදි වර්ගයෙන් ඔවුන්ට යටත් පිරිසෙයින් නිල ඇඳුම් කට්ටල තුනක්වත් තිබිය යුතුය. සියළුම ශිෂ්‍යයින් පාසැලේ නීති රීති වලට එකඟවිය යුතුය. පාසැලේ විස්තර පිටපතක් පහත නම් සඳහන් අයගෙන් ලබාගත හැක.

6. ඉල්ලුම්පත් මීට සම්බන්ධකොට ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ආකාරයට විය **යුතුය.**

7. මේ සඳහා එවනු ලබන ඉල්ලුම්පත් සථිර ලේකම්, රාජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, 19, ලොංඩන් පෙදෙස, කොළඹ 7 යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත් භාරගැනීම 1965 සැප්තැම්බර් මස 17 වැනිදායින් අවසන් වෙයි.

ඩී. අලුවිහාරේ,
සථිර ලේකම් වෙනුවට.

1965 අගෝස්තු මස 13 වැනිදා,
කොළඹ 7, ලොංඩන් පෙදෙසෙහි,
අංක 19 දරණ ස්ථානයේ,
රාජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

**කොළඹ, රජයේ භෝජනාගාර පාසැලේ අභ්‍යාසය ලැබීම සඳහා 1965 ඔක්තෝබර් මාසයෙන් ඇරඹෙන අධ්‍යයන වාරයට ඇතුලත්වීමේ අයදුම් පත**

(1) සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය මුලට යොදන්න)

(2) තැපැල් ලිපිනය :————.

(3) 1965 සැප්තැම්බර් මස 17 වැනි දිනට වයස, අවුරුදු :——, මාස :——, දින :——.
(උප්පැන්න සහතිකය ඇමිණිය යුතුය)

(4) අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය)

(5) ලංකාවේ පුරවැසියෙක් වනුයේ—
(අ) පරපුරෙන් ද :————.
(ආ) ලියාපදිංචි කිරීමෙන් ද යන බව :————.
(ලියාපදිංචියෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න)

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-991—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**නිවේදක තනතුර (ඉංග්‍රීසි)**

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිවේදක තනතුරක් (ඉංග්‍රීසි) සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1965 සැප්තැම්බර් 10 වැනි දිනට පළමු ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් " කොළඹ 7, ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් " වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " ඉංග්‍රීසි නිවේදක " යන්න පැහැදිලිව **ලිවිය යුතුයි.**

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය, රු. 2,700—10×120 හා 6×180—රු. 4,980 කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මුල් වතාවේ පත්වීම දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(1) සෑම අයදුම්කරුවෙක්ම යට දැක්වෙන අවශ්‍යතා සතු බව ඔප්පුවෙන සෑහෙන සාක්ෂි **ඉදිරිපත් කළ යුතුයි :—**

(අ) 1965 දෙසැම්බර් 10 වැනි දිනට වයසින් අවුරුදු 18 ට නො අඩු හා 40 ට නොවැඩි බව.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව හෝ අඩු වශයෙන් ලංකා විශ්ව විද්‍යාලයේ කලා හෝ විද්‍යා ප්‍රථම පරීක්ෂණයේ සාමාර්ථය හෝ කලා හෝ විද්‍යා මධ්‍ය පරීක්ෂණයේ සාමාර්ථය හෝ වෙනත් කවර හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක සමාන පරීක්ෂණයකින් සාමාර්ථය ලබා ඇති බව.

(ඇ) මනා චරිතයකින් ද කායික සෞඛ්‍යයෙන් ද යුක්ත බව.

(2) ලංකාවේ හෝ පිට රටක ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ කලින් පළපුරුද්දක් ලබා ඇති අයගෙන් ද ඉහත දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් නොමැතිවත් ඉල්ලුම්පත් භාරගනු ලැබේ. ඔව්හු තම ඉල්ලුම්පත් එවන විට එම පළපුරුදුකම ඔප්පුවන සාක්ෂි ඉදිරිපත් කළ යුත්තාහ.

(3) මෛක්‍රෆෝනයට උචිත කටහඬක් අයදුම්කරුවන්ට තිබිය යුතුයි.

5. ඉල්ලුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලි වල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතු යි.

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය, සහ

(ii) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්‍ය්‍ය ශූරත්වය සහ තනතුරට පත්කිරීමට ඇති යෝග්‍යත්වය දැක්වෙන මෑතක දී ලබාගත් සහතික දෙකක් (රජයේ සේවයේ දැනටම යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙම උප ඡේදය යටතේ සහතික අනවශ්‍යය.)

**සැළකිය යුතුයි.**—මෙම ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්කරුවන් වෙත පෙරලා එවනු නො ලැබේ. මුල් ලියකියවිලි එවිය යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුව හොත් හා එවිට ය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්‍යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාලසීමාව තුළ දී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස භාරගනු නො ලැබේ.

7. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධයෙන් සෙසු ලියකියවිලි එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ මුල පළවන රාජ්‍යසේවා පත්කිරීම් වලට අදාල පොදු කොන්දේසි බලනු මනාය.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

වර්ෂ 1965 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**නිවේදක තනතුර (ඉංග්‍රීසි)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
(ආ) සෙසු නම් :————.

2. සථිර ලිපිනය :————.

3. (අ) 1965 සැප්තැම්බර් 10 වැනි දිනට නියම වයස :————.
අවුරුදු :————. මාස :————. දින :————.
(ආ) උපන් දිනය හා ස්ථානය :————.

4. ජාතිය :————.
(i) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද යනවග :————.
(ii) ලාංකිකත්වය පාරම්පරිකව නම් යට සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :————.
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඉ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඊ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(5 (1) ඡේදය යටතේ සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

6. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පළපුරුද්ද, විස්තර වශයෙන් :————.

7. අමුනා එවා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් :————.

8. සේවා මුක්ත භටයන් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේ ද යනවග :————.

9. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම්, ඒ කවදාද, කොතැනද යනවග :————.
(ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලය වෙන් වශයෙන් දැක්විය යුතුයි.) .

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8-1047—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

අංකය : ශිෂ්‍ය/517.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1966 නයිජීරියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1966 ඔක්තෝබර් සිට නයිජීරියානු විශ්ව විද්‍යාලයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශිෂ්‍යත්ව ප්‍රදානයන්ගේ අරමුණ වනුයේ (මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි අංශයේ පළවී ඇති ඉංග්‍රීසි නිවේදනයේ සඳහන් ක්ෂෙත්‍රයන්ගෙන් කිසිවක) නයිජීරියාවේ පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ කටයුතු සඳහා ලාංකික ශිෂ්‍යයින්ට අවස්ථාවක් ලබා දීමය. ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් භාරගනු නොලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේ වයක් ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, . ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණ ය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණ ය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණ ය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අවුරුදු 2 ක් වන්නේ ය. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නො හැකි වීම නිසා හෝ නයිජීරියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ආ) 1966.10.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ඉ) රජයේ සේවකයෙක් නම්, 8 වැනි ප්‍රමාණයේ මට්ටමට සිංහල දැනීමක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ හැකි විය යුතු යි.

(ඊ) අනුගමනය කිරීමට අදහස් කරන පාඨමාලාවට උචිත පරිදි, පිළිගත් විශ්ව විද්‍යාලයයක දෙවැනි පෙළ උපාධියක්වත් යටත් පිරිසෙයින් ලබා සිටිය යුතුයි. (ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.)

(උ) උසස් ඉංග්‍රීසි ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට, 1966.10.1 වනවිට, ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේ ම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතු ය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) නයිජීරියාව බලා යාම හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු පෙරළා ලංකාවට පැමිණීම සඳහා ගමන් වියදම්.

(ආ) අනුමත කළ ඉගැන්වීමේ ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු.

(ඉ) වර්ෂයකට පවුම් 700 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක්.

(ඊ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට පවුම් 25 ක දීමනාවක්.

(උ) ඉගෙනීමේ කටයුතු සම්බන්ධයෙන් නයිජීරියාව ඇතුළත අනුමත කරන ලද ගමන් වියදම් සඳහා වර්ෂයකට පවුම් 100 කට නොවැඩි දීමනාවක්.

(නයිජීරියානු විශ්ව විද්‍යාලයයන්හි ශිෂ්‍ය නිවාස දැනට පිළියෙළවී ඇත්තේ තනි ශිෂ්‍යයින් සඳහා වන නිසාත්, වෙනත් සුදුසු නේවාසික පහසුකම් ලබා ගැනීම අපහසු නිසාත්, අපේක්ෂකයින් අවාහක වම හෝ විවාහක නම් පවුලේ සාමාජිකයින් ලංකාවේ රඳවා පැමිණීම අපේක්ෂා කරනු ලැබේ.)

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් නයිජීරියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාල සීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් නයිජීරියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු යි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නො කෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1965.9.13 වැනි දින පස්වරු 4.30 ට පෙර ලැබෙන සේ, කොළඹ 3, " සිරිමතිපායේ ", අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, මේ අවශ්‍යතාව සපුරාලිය යුතු වන්නේ ය.

16. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 21 වැනිදා,
කොළඹ 3, "සිරිමතිපායේ"
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

8-938—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## කිරි මණ්ඩලය

### ගබඩාකරු තනතුර (වැඩපලේ ආයුධ ගබඩාව)

කිරි මණ්ඩලීය සේවයේ ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආදර්ශ ෆෝර්මය අනුව සකස් විය යුතු අතර, ඒවා 1965 සැප්තැම්බර් මස 15 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**2. අවශ්‍ය සුදුසුකම් :—**

පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම ඉල්ලුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(අ) හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් හා සදාචාර චරිතයකින් යුක්ත බව,

(ආ) පරම්පරානුගතව හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙකු බව,

(ඇ) අවුරුදු 25 කට නොඅඩු සහ 40 කට නොවැඩි බව,

(ඈ) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඒ සමාන සුදුසුකම් තිබෙන බව,

(ඉ) විශේෂයෙන්ම ආයුධ පිළිබඳ හා මෝටර් රථවාහන කොටස් පිළිබඳ යාන්ත්‍රික ගබඩාවක අඩුම වශයෙන් 3 අවුරුද්දක පළපුරුදු කම් ඇතුළුව යටත් පිරිසෙයින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ගැන 5 අවුරුද්දක පළපුරුදුකම් තිබිය යුතු අතර, ගබඩා කාර්ය පරිපාටිය ගැන දැනුම සහ වැඩ පලේ ආයුධ හඳුනාගැනීමේ හැකියාව ඇති බව.

**3. ඇපය.**—තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරු විසින් මුදලින් රුපියල් 750 ක් හෝ රුපියල් 1,000 ක ඇප ඔප්පුවක් තැබිය යුතුය.

**4. වැටුප, දීමනා සහ සේවා කොන්දේසි :—**

(අ) මේ තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 888 න් පටන් ගෙන වර්ෂයකට රු. 72 බැගින් වැඩිවී රු. 2,472 දක්වා නගී. රජයේ රෙගුලාසි අනුව ගෙවල් කුලී දීමනාද, ජීවන වියදම් දීමනාද, විශේෂ ජීවනාධාර දීමනාද මේ වැටුපත් සමග ගෙවනු ලැබේ.

(ආ) පත්වීම දෙනු ලබන දිනයේ සිට 3 වර්ෂයක් ගතවන තුරු එය ස්ථිර නොවේ.

(ඇ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට කර ඇති සියළුම ව්‍යවස්ථාවන්ටද, අනාගතයේදී කරනු ලබන සියළු ව්‍යවස්ථාවන්ටද "නව ප්‍රවේශක නිලධාරීන්" යටත් වියයුතුය. මෙය විශේෂයෙන්ම බලපානු ලබන්නේ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාවේ යෙදවීම සඳහාය.

(ඈ) තුන් අවුරුදු කාලය තුළදී ඉල්ලුම්කරුවන් සිංහල පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(ඉ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවය ස්ථිර කිරීම රඳා පවතින්නේ වෙනත් කරුණු සමග නිශ්චිත කාලය තුළදී නියමිත සිංහල ප්‍රවීණතා විභාග සමත්වීම උඩය. නියමිත කාලය තුළදී මෙම ප්‍රවීණතා විභාගයන් සමත් නොකළ හොත් ගෙවීමට නියමිත වැටුප් වැඩිවීම එය සමත් වන තෙක් ගෙවනු නොලැබේ. තුන් අවුරුදු කාලය අවසාන යේදී නියමිත විභාග සමත් කිරීමට නොහැකි වුවහොත් නිලධාරියාගේ සේවය අවසන් කරනු ලැබේ.

5. තමන්ගේ ඉල්ලුම් පත් වලට පහත සඳහන් සහතික පත් වල පිටපත් (මුල් පිටපත් නොව) ඉල්ලුම් කරුවන් විසින් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය. (සැ. යු. බෞද්ධස්ම සහත්ක හෝ ආධාර ලබන පාසැල් සඳහා සංකේත රෙගුලාසි වෙනුවෙන් නිකුත් කර ඇති සහතික භාර ගනු නොලැබේ.)

(ආ) මේ තනතුර සඳහා ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය හඳුන්වන මෑතකදී ගන්නා ලද සහතික 3 ක් එවිය යුතුය. මෙයින් එකක් ඉල්ලුම්කරු ඉගෙන ගත් පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන් වියයුතුය.

සැ. යු.—මේ සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩල වල නිල ධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු භාර ප්‍රධානීන් භාරයේ එවිය යුතුය. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන් නාවූ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

7. **වෛද්‍ය විභාගය.**—පත් කරනු ලබන ඉල්ලුම්කරු සේවය ආරම්භ කිරීමට ප්‍රථම රජයේ වෛද්‍ය ආයතනයක වෛද්‍ය විභාගයකට පෙනී සිට එයින් සමත් විය යුතුය.

8. ඉල්ලුම්පත් හා එයට අදාල වෙනත් ලිපි එවිය යුත්තේ සාමාන්‍යාධිකාරී, කිරි මණ්ඩලය, යන ලිපිනයට මිස මණ්ඩලීය සේවයේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

9. ඉල්ලුම්කරුවන් තමන්ගේ වියදමින්ම කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වියයුතුය.

10. ඉල්ලුම් පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.

සාමාන්‍යාධිකාරී,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
කොළඹ 5, 1965.8.20.

### අයදුම්කරුගේ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.
2. පුද්ගලික ලිපිනය (පැහැදිලිව ලියන්න) :————.
3. වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. ඉල්ලුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
5. ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඉදිරිපත් කළයුතුය)
6. කලින් ලබා ඇති පලපුරුදුකම් පිළිබඳ විස්තර :————.
7. දැනට කරන රැකියාව :————.
8. මෙයට අදාල වෙනත් විශේෂ හිමිකම් :————.

මෙම ඉල්ලුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද තොරතුරු සියල්ලක්ම සත්‍ය හා නිවැරදි ඒවා බව සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8-968—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ඇබෑර්තු

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ පහත සඳහන් ඇබෑර්තු සඳහා ලාංකිකයන්ගෙන් (පිරිමි) ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

**1. සහකාර ගණකාධිකාරී**

වැටුප් **ක්‍රමය.**—රු. 600—රු. 40 × 10—රු.1,000 (සියල්ල අඩංගු මාසික).

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35ට අඩු විය යුතුය ;
(ආ) යටත් පිරිසෙයින් වරලත් හෝ සංස්ථා බලය ලත් හෝ පිරිවැය හා වැඩ පිළිබඳ හෝ ලියාපදිංචි කරන ලද ගණකාධිකාරී ආයතනයක මධ්‍ය පරීක්ෂණයෙන් සාමාර්ථයක් හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය සමග යටත් පිරිසෙයින් ගිණුම් වැඩ සම්බන්ධව අවුරුදු හයක පළපුරුද්දක් තිබිය යුතුය.

**2. ලිපිකරු II (විකුණුම් ලෙජර් ලිපිකරු)**

**වැටුප් ක්‍රමය.**—රු. 250—රු. 10× 10, රු. 15 × 10 රු. 500 (සියල්ල අඩංගු මාසික).

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නො වැඩි විය යුතුය ;
(ආ) ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයේදී විෂයයන් 6ක් සහිතව ; හා
(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ විශාල වෙළඳ ආයතනයක අවුරුදු 5 ක විකුණුම් ලෙජරය ලිවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

**3. ලිපිකරු II (මිළ කිරීමේ)**

**වැටුප් ක්‍රමය.**—රු. 250—රු. 10×10, රු. 15×10—රු. 500 (සියල්ල අඩංගු මාසික).

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය ;
(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී ගණිතය සම්මාන සහිත විෂයයන් 6 කින් සාමාර්ථය හා පිරිවැය හා වැඩ ගණකාධිකාරී ආයතනයේ I වැනි පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා සිටිය යුතුය ;
(ඇ) විශාල වෙළඳ ආයතනයක හෝ, රජයේ සංස්ථාවක අඩු වශයෙන් අවුරුදු 3 ක මිළ කිරීමේ ලිපිකරුවෙකු වශයෙන් පළපුරුද්දක් තිබිය යුතුය.

**4. ලිපිකරු II (ඉන්වොයිස් ලිපිකරු)**

**වැටුප් ක්‍රමය.**—රු. 250—රු. 10×10, රු. 15×10—රු. 500 (සියල්ල අඩංගු මාසික).

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය ;
(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය සාමාන්‍ය විභාගයේදී විෂයයන් 6ක් සහ අවුරුදු 5 ක ඉන්වොයිස් කිරීමේ පිළිබඳ පළපුරුද්දක් ; හා
(ඇ) තෝරා ගනු ලබන අපේක්ෂකයන් සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් වැඩ කිරීමට පුළුවන් විය යුතුය.

**5. සැලසුම්කරු (කාර්මික ඉංජිනේරු)**

**වැටුප් ක්‍රමය.**—රු. 300—රු. 15 × 10, රු. 25 × 10—රු. 700 (සියල්ල අඩංගු මාසික).

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 45ට අඩු විය යුතුය ;
(ආ) අයදුම්කරුවනට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමාන හෝ උසස් සහතිකයක් සමග පහත සඳහන් සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය :—

(i) කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා (සන්ධ්‍යා පන්ති) සහතිකය හා පිළිගත් ඉංජිනේරු වැඩ පොළක හා සැලසුම් කාර්යාලයකදී, අවුරුදු 5 ක ආධුනිකත්වයක් තිබිය යුතු අතර, එකී ආධුනිකත්වයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක් සැලසුම් කාර්යාලයක විය යුතුය ;

(ii) කාර්මික විද්‍යාව පිළිබඳ කණිෂ්ඨ කාර්මික නිලධාරී (ජේ.ටී.ඕ.) සහතිකය හා පිළිගත් ඉංජිනේරු වැඩ පොළක අවුරුදු තුනක ආධුනිකත්වයක් තිබිය යුතු අතර, එකී ආධුනිකත්වයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක් සැලසුම් කාර්යාලයක විය යුතුය.

සේවා කොන්දේසි හා අනෙකුත් වරප්‍රසාද සංස්ථාවේ අනෙකුත් සේවකයන්ට බලපාන පරිදිය.

රජයේ අංශයේ ඉල්ලුම් පත් ඔවුනොවුන්ගේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ මණ්ඩල මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව, සකස් කර ගත් ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 17 වැනි දිනට හෝ ඊට ප්‍රථම :—

" සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, අංක 242,
හැව්ලොක් පාර,
කොළඹ 5. "

යන ලිපිනයට ලැබෙන ලෙස එවිය යුතුය. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත්‍ර ගැන මෙම සංස්ථාව වග නොකියනු ලැබේ. මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර නිකුත් නො කරන අතර, ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වා නොඑවන බැව් සැලකිය යුතුය.

ලේකම්.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, අංක 242, හැව්ලොක් පාර,
කොළඹ 5.
1965 අගෝස්තු මස 20 වැනි දින.

### ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

1. සම්පූර්ණ නම :————.
(අ) අගට යෙදෙන නම :————.
(ආ) වෙනත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. (අ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.) :————.
4. ජාතිය :————.
5. කසාද බැඳලාද, නැද්ද යන වග (කසාද බැඳලාද, තනිකඩද, භාර්යාව මළ කෙනෙක් ද යන්න සඳහන් කරන්න, කසාද බැඳලා නම් කසාද බැඳි දිනය හා ළමයින් ගණන සඳහන් කරන්න.) :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් හා එය ලැබූ දිනයද, පෙනී සිටි විෂයයන් ද සඳහන් කරන්න :————.
(සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි)
7. පාසැලින් අස්වූවාට පසු සේවය පිළිබඳ විස්තර; සේවයට බැඳුන දින, අස්වූ දින, සේවය කළ සේව්‍යයාගේ නම හා ලිපිනය, ලබන ලද වැටුප් හා කළ සේවා සඳහන් කරන්න :————.
(සහතිකවල පිටපත් තිබේ නම් අමුණා එවන්න.)
8. (අ) සිංහල පිළිබඳ ප්‍රවීණත්වය :————.
(ආ) ඉංග්‍රීසි පිළිබඳ ප්‍රවීණත්වය :————.
(සමත් වී ඇති ඉහළම පරීක්ෂණය සඳහන් කරන්න.)
9. චරිත සහතික දී ඇති අයගේ නම් හා තනතුරු. මෙම සහතික වල පිටපත් අමුණා එවිය යුතුයි :—
(1) ————.
(2) ————.
(3) ————.
10. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :————.

ඔබ තෝරාගනු ලැබුවහොත් වැඩ භාර ගත හැකි ලඟම දිනය සඳහන් කරන්න.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කොට ඇති විස්තර නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කිසියම් විස්තරයක් අසත්‍ය හෝ වැරදි බැව් හෙළි වුවහොත් තෝරා ගැනීමට ප්‍රථම හෝ තෝරා ගැනීමෙන් පසු මා නුසුදුස්සෙකු කිරීමටත්, පත් කිරීමෙන් පසු වැරදි බැව් හෙළි වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1026/1—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

**පුහුණු ශ්‍රේණීන් සඳහා ඇබෑර්තු—65.7.30 දිනැති රජයේ ගැසට් නිවේදනය සම්බන්ධවයි**

ඉහත සඳහන් ඇබෑර්තු සඳහා අයදුම්පත් බාරගන්නා අවසාන දිනය 65.9.15 වෙනි දින දක්වා දීගුකොට ඇති බව සියළුම අපේක්ෂකයන් වෙත මෙයින් දන්වමු.

242, හැව්ලොක් පාර,
කොළඹ 5.
1965 අගෝස්තු 23 ද.

ලේකම්.

8–1026/2—65.8.27 දින අංක 14,490 දරණ ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, කුඩා කර්මාන්ත සේවා ආයතනයේ, පුහුණු කම්කරු තනතුරු ඇබෑර්තු

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ, මොරටුව වෙලෝනාවෙහි පිහිටැවී ඇති කුඩා කර්මාන්ත සේවා ආයතනයෙහි, යන්ත්‍ර ක්‍රියා කරවන්නන්, '' මිලර්'', '' ෂේපර් '' සහ '' ඩ්‍රිලර් '' කම්කරුවන්, කාර්මිකයන්, විදුලි කාර්මිකයන්, පෑස්සුම් කරුවන්, ඇඹුම් කරුවන් සහ ආදර්ශසාදන්නන් පිළිබඳ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර බාර ගනු ලැබේ. මේ නිවේදනයට යාකර ඇති ආකෘතියේ ප්‍රකාර සකස් වුණු ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් 22 දින නොඉක්මැවී මට ලැබෙන පරිදි එවිය යුතු ය. මේ තනතුරු පරිපාටියත් එයට අදාළ වැටුප් ක්‍රමත් පහත දක්වේ :—

| තනතුරු | | වාර්ෂික වැටුප් ක්‍රමය (මූලික) |
|---|---|---|
| (අ) උද්ධෘත ශ්‍රෙණිය | ... ... | රු. 1,320—රු. 72 බැගින් 12—රු. 2,184 |
| (ආ) උද්ධෘත ශ්‍රෙණිය | ... ... | රු. 960—රු. 72 බැගින් 11—රු. 1,752 |
| (ඉ) I පංතිය (කලින් පුහුණු I ශ්‍රෙණිය) ... | ... | දිනකට රු. 3/86 බැගින් මුල් 6 මාසයට—ඉන්පසු රු. 1,170—රු. 42 බැගින් 12—රු. 1,674 |
| (ඊ) II පංතිය (කලින් පුහුණු II ශ්‍රෙණිය) | ... | දිනකට රු. 2/30 බැගින් මුල් 6 මාසයට—ඉන්පසු රු. 750—රු. 42 බැගින් 13—රු. 1,296 |

2. තනතුරු ස්ථිර ය. එහෙත් විශ්‍රාම වැටුපට හිමි නැත. තෝරාගනු ලබන අපේක්ෂකයන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් විය යුතු ය.

3. සුදුසුකම්.—ඉහත සඳහන් තනතුරු පිළිබඳ අධ්‍යාපන සහ/නොහොත් කාර්මික සහතික, පළපුරුද්ද, වයස් සීමා සහ වෙනත් තොරතුරු පහත දක්වේ :—

| තනතුර | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | සේවා සුදුසුකම් | සාමාන්‍ය සුදුසුකම් | විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|---|
| (අ) උද්ධෘත ශ්‍රෙණිය: (I ශ්‍රෙණියේ කණිෂ්ඨ පරිපාලක)— | | | | | |
| | (i) 21ට ඉහළ ... | ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය | අනුමත කරන ලද, ආණ්ඩුවේ පුහුණු කිරීම් වැඩ පිළිවෙළක 5 අවුරුදු ආධුනික කාල සීමාවක්. | — ... | — |
| නොහොත් ... | (ii) 29ට ඉහළ ... | කියැවීමට සහ ලිවීමට පිළිවන්කම | තමා පරිපාලනය කළ යුතු යයි අපේක්ෂා කැරෙන පංතියේ වැඩ පිළිබඳ II ශ්‍රෙණියේ කණිෂ්ඨ පරිපාලක යෙකු ලෙස 4 අවුරුදු සේවයක්. | මෙහි තත්ත්වය නිර්දේශ උපලේඛනය අනුව, තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම, ස්ථානෝචිත ප්‍රඥ ව, විචක්ෂණ භාවය, නා යකත්වය සහ ගතවූ 5 අවුරුද්ද තුළ හොඳ චරියා වාර්තාවක් ඇතිව සිටීම. | ආණ්ඩුවේ වෘත්තීය පාඨ ශාලා, නගර සහ ''ගිල්ඩ්'' ආයතන, කාර් මික විද්‍යාලයවල් නො හොත් ඒ ඒ කර්මාන්ත විශේෂයට ඇරුණු වෙනත් සමාන ආයතන වැන්නෙන් ලත් සහතික බඳු කාර්මික සහතික ඇති අය ගැන විශෙෂ යෙන් සළකනු ලැබේ. |
| නොහොත් ... | (iii) 29ට ඉහළ ... | 8 පංතිය ... | කර්මාන්ත කාරයකු සහ පරිපාලකයකු වශයෙන් එකතුව 15 අවුරුද්දක සේවය මෙයින් අඩු ගණ නේ අවුරුදු 7ක් වත් යටත් පිරිසෙයින් මිනි සුන් 50 දෙනෙකුවත් භාර පරිපාලකයකු ලෙස විය යුතුය. අවුරුදු 5ක් වත් පිළිගත් ආයතනයක කර්මාන්ත කාරයකු ලෙස විය යුතුය. (මේ සඳහා සහතික තිබිය යුතුයි). | මෙහි තත්ත්වය නිර්දේශ උපලේඛනය අනුව, තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම | — |
| (ආ) උද්ධෘත ශ්‍රෙණිය: (II ශ්‍රෙණියේ කණිෂ්ඨ පරිපාලක) — | | | | | |
| | (i) 25ට ඉහළ ... | කියැවීමට සහ ලිවීමට පිළිවන්කම | I (කලින් පුහුණු I ශ්‍රෙණිය) සහ/නො හොත් II (කලින් පුහුණු II ශ්‍රෙණිය) පංතිවල 5 අවුරුද්දක සේවය. | මෙහි තත්ත්වය නිර්දේශ උපලේඛනය අනුව, තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම, ස්ථානෝචිත ප්‍රඥ ව, විචක්ෂණ භාවය, හොඳ චරියා වාර්තාව සහ කම් කරුවන් පාලනය කළ හැකි බව. | ආණ්ඩුවේ වෘත්තීය පාඨ ශාලා, නගර සහ ''ගිල්ඩ්'' ආයතන, කාර් මික විද්‍යාලයවල් නො හොත් ඒ ඒ කර්මාන්ත විශේෂයට ඇරුණු වෙනත් සමාන ආය තන වැන්නෙන් ලත් සහතික බඳු සහතික ඇති අය ගැන විශේෂ යෙන් සළකනු ලැබේ. |
| නොහොත් ... | (ii) 25ට ඉහළ ... | 8 පංතිය ... | පිළිගත් ආයතනයක් යටත් පිරිසෙයින් 20 දෙනකුට වත් වැඩි සේවක සංඛ්‍යාවක පාල නය බාරව, පරිපාලක යකු ලෙස 5 අවුරුද්දක් වත් සේවය (සහතික වලින් සිටුබල සැපැයිය යුතු) එම පංතියේ වැඩ වලම අඩු ගණනේ 5 අවුරුද්දක් වත් කර් මාන්ත කාරයකු ලෙස යෙදී සිටියකු ද විය යුතු ය. | — ... | — |

| තනතුර | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | සේවා සුදුසුකම් | සාමාන්‍ය සුදුසුකම් | විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|---|
| නොහොත් ... | (iii) 25ට ඉහළ ... | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය | පිළිගත් ආයතනයක, යටත් පිරිසෙයින් 20 දෙනකුට වත් වැඩි සේවක සංඛ්‍යාවක පාලනය බාර ව, පරිපාලකයකු ලෙස 5 අවුරුද්දක වත් සේවය (සහතික වලින් පිටුබල සැපැයිය යුතු). | — ... | — |
| (ඉ) 1 පංතිය (කලින් පුහුණු I ශ්‍රේණිය): | | | | | |
| | (i) 25ට ඉහළ ... | කියැවීමට සහ ලිවීමට පිළිවන්කම | (i) II පංතියේ 8 අවුරුද්දක සේවය<br>(ii) II පංතියේ අඩු ගණනේ අවුරුදු 3ක වත් සේවයක් සහ පිළිගත් ආයතනයක පළමු වන පංතියේ කර්මාන්ත කාරයන් ලෙස යටත් පිරිසෙයින් 6 අවුරුද්දක වත් සේවයක් ඇති සේවකයෝ (පිටුබල වශයෙන් සහතක තිබිය යුතු). | මෙහි තත්ත්ව නිර්දේශ උපලේඛනය අනුව තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම. ... | — |
| | (ii) 25ට ඉහළ ... | කියැවීමට සහ ලිවීමට පිළිවන්කම | කර්මාන්ත කාරයකු සැටියට 10 අවුරුද්දක වත් සේවය. මෙයින් 6 අවුරුද්දකවත් පිළිගත් ආයතනයක පළමු වන පංතියේ කර්මාන්ත කාරයකු ව සිටිය යුතු ය. (පිටුබල වශයෙන් සහතික තිබිය යුතු). | — ... | — |
| (ඊ) II පංතිය (කලින් පුහුණු II ශ්‍රේණිය): | | | | | |
| | (i) 21ට ඉහළ ... | 8 පංතිය ... | (i) අනුමත කරන ලද ආණ්ඩුවේ පුහුණු කිරීම් වැඩ පිළිවෙලක 5 අවුරුදු ආධුනික කාල සීමාවක්.<br>(ii) මූලික කාර්මික අභ්‍යාස ආයතනයෙහි අවුරුදු 1½ක් සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක 4 අවුරුදු සේවයක්. | ආධුනික කාල සීමාව සාර්ථක ලෙස ගෙවා තත්ත්වය නිර්දේශ උපලේඛනය අනුව ලැබිය යුතු තත්ත්වය ලබා සිටිය යුතු. ... | — |
| නොහොත් ... | (ii) 21ට ඉහළ ... | — ... | (i) III සහ IV පංතිවල අඩු ම වශයෙන් 5 අවුරුද්දක හෝ සේවය. යටත් පිරිසෙයින් මින් අවුරුදු 3ක් වත් III පංතියේ සේවය වියයුතු. | මෙහි තත්ත්ව නිර්දේශ උප ලේඛනය අනුව තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම. | (I) පෙලේ සේවකයන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ. |
| | | | (ii) III පංතියෙහි, අඩු ම වශයෙන් අවුරුදු 2ක වත් සේවයක් ඇති, පිළිගත් ආයතනයක කර්මාන්ත කාරයන් ලෙස තවත් අවුරුදු 3ක් නොහොත් එයට වැඩි සේවයක් ඇති සේවකයෝ (පිටුබල වශයෙන් සහතික තිබිය යුතු). | — ... | — |
| නොහොත් ... | (iii) 21ට ඉහළ ... | කියැවීමට සහ ලිවීමට පිළිවන්කම | පිළිගත් ආයතනයක එම ශ්‍රේණියෙහි ම 5 අවුරුද්දක පළපුරුද්ද (පිටුබල වශයෙන් සහතික තිබිය යුතු). | මෙහි තත්ත්ව නිර්දේශ උප ලේඛනය අනුව, තමා යොදවනු ලබන වැඩ කට යුතු පිළිබඳ පළපුරුද්ද සහ දැනීම ... | — |

4. ඉල්ලුම්කාරයන් විසින් තමන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (සහතික නො වේ) ඈමිණිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතික ය හෝ උපකෘත පාඨශාලා සම්බන්ධයෙන් අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කැරුණු සහතිකය හෝ නො වේ)

(ආ) ලබා තිබෙන ඉහළ ම අධ්‍යයන සහතික පත්‍රය සහ කාර්මික සහතික;

(ඉ) ඉල්ලුම් කාරයාගේ සහතික, චරිතය සහ මේ තනතුරට පත්කරනු ලැබීමට යෝග්‍ය බව සඳහන් කොට ලගදී ලබාගත් සහතික තුනක් දැනටත් ( ආණ්ඩුවේ සේවයෙහි සිටින්නවුන් විසින් මේ උපවගන්තිය යටතේ අපේක්ෂිත සහතික ඉදිරිපත්කිරීම අවශ්‍ය නැත);

සැලැකිය යුතුයි.—මේ සහතික පිටපත් ආපසු එවනු නො ලැබේ.

5. දැනටත් ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනය ඉක්මී, මේ කායාර්ලයට ලැබෙන එබඳු ඉල්ලුම් පත්‍ර, ප්‍රමාදයට සෑහෙන හේතු ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් එය පිළි ගන්නා ලෙස නිර්දේශ කරනු නොලැබුව හොත් බාරගනු නො ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර හෝ එයට අදාළ වෙනත් ලියකියවිලි හෝ පෞද්ගලිකව මා නමට නොහොත් දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකු නමට නොව ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන නමට, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයට යොමුකළ යුතුය.

7. ආණ්ඩුවේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I කොටස ආරම්භයෙහි (II) ඡේදයේ එන සාමාන්‍ය කොන්දේසි බැලිය යුතුය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැන.

1965 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රය.

## ඉල්ලුම් පත්‍රය

### පුහුණු කම්කරු තනතුර—කුඩා කර්මාන්ත සේවා ආයතනය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   අගට යෙදෙන නම :————.
   අනෙක් නම් :————.
2. ලිපිනය :————.
3. පුරවැසි බව සහ එය ලබාගත් අන්දම :————.
   (පරම්පරාවෙන්ම ලාංකිකද නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ලාංකිකද යනබව සඳහන් කරන්න).
4. උපන් දිනය :————.
   1965.9.22 දිනට වයස :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඉ) ඉල්ලුම්කරුගේ මුත්තා :————.
   (ඊ) ඉල්ලුම්කරුගේ මී මුත්තා :————.
6. සමත්වූ විෂයයන් හා දිනයන්ද සහිතව ලබන ලද උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (විභාගය ගත්තා ලද මාධ්‍යය සඳහන් කරන්න) :————.
7. ඉගෙන ගත් පාසැල සහ ඉන් අස්වූ දිනය :————.
8. ලබාගත කාර්මික සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ විස්තර (නිවේදනයේ (3) ඡේදයේ සඳහන් සුදුසුකම්වලින් තමාට ඇති සුදුසුකම් මෙහි සඳහන් කළ යුතුය) :————.
9. ඉල්ලුම් කරන තනතුර සඳහා තමා ලබා ඇති ප්‍රායෝගික පළපුරුද්ද ගැන සම්පූර්ණ විස්තර (සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
   ඉල්ලුම් කරන තනතුර සහ පංතිය/ශ්‍රෙණිය සඳහන් කරන්න :————.
10. පාසැලෙන් අස්වූ තැන් සිට කරන ලද රැකියාවන් හා එම සේවා කළ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
11. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුරු සහ ලිපිනයන් :—
    1. ————————.
    2. ————————.
    3. ————————.
12. ඉදිරිපත් කළහැකි විශේෂ සුදුසුකම් (වෘත්තීය හා කාර්මික) හා විශේෂ අයිතිවාසිකම් ඇත්නම් ඒ සම්බන්ධ විස්තර :————.

මෙ ඉල්ලුම් පත්‍රයේ මවිසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍යද, නිවැරදිද බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් කවර හෝ තොරතුරුක් තෝරා ගැනීමට කලින් අසත්‍ය හෝ වැරදි බව පෙනී ගියහොත්, මා එයට නුසුදුසු වන බවත්, පත් කිරීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි හෝ බව සොයා ගන්නා ලද නම් අලාභයක් නොගෙවා අස්කර දමනු ලබන බවත් මම දනිමි.

දිනය :————.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

ලියුම් යොමුව :
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7.

8—1036—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### අපරදිග සංගීත වැඩ සටහන් සහායක තනතුර

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අපරදිග සංගීතය වැඩ සටහන් සහායක තනතුරක් සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ. මෙම දැන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1965 සැප්තැම්බර් 10 වැනි දින නොඉක්මවා ලැබෙනසේ ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 7, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු යි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "වැඩ සටහන් සහායක" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතු ය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—9 × 120—8 × 180 හා 4 × 240—රු. 6,300 කි.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක ආධුනික කාලයකටය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම් කරුවෙකුම යට දැක්වෙන කරුණු ඔප්පු කෙරෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු යි :—

(අ) 1965 සැප්තැම්බර් 10 වැනි දිනට වයසින් අවුරුදු 21 ට නො අඩු හා 45 ට නොවැඩි බව. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම වයස් සීමාවන් බලපාන්නේ නැත.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ/ගුවන් විදුලි සේවය සඳහා විශේෂ වටිනාකමක් ඇති නාට්‍ය, සංගීතය හෝ කථනය පිළිබඳ වෘත්තීය උපාධියක් හෝ ඩිප්ලෝමා උපාධියක් හෝ සහතිකයක් හෝ ඇති බව (ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලැබූ ගුවන් විදුලි සේවා පිළිබඳ පස් අවුරුද්දක පළපුරුද්දක් ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි කටයුතු පිළිබඳව නිරතව සිටින සේවකයන්ගෙන් මෙම සුදුසුකම් ඉල්ලා සිටිනු නො ලැබේ.)

(ඇ) අපරදිග සංගීතය පිළිබඳ මනා දැනුමක් තිබීම හා පිළිගත් සංගීත පාසලකින් හෝ විද්‍යාලයකින් ලබන ලද උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් සතුව තිබීම. ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ දැනුම ගැන ප්‍රධාන වශයෙන් සැලකිල්ල දක්වන නමුත් ජනප්‍රිය සංගීතය හා නැටුම් සංගීතය පිළිබඳ සාමාන්‍ය දැනුම අයදුම්කරුවන්ට තිබිය යුතුයි. සංගීත භාණ්ඩයක් වාදනය කිරීමේ දැනුම, විශේෂයෙන් පියානෝ වාදනය කිරීමේ දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

(ඈ) මනා චරිතයකින් ද කායික සෞඛ්‍යයෙන් ද යුක්ත බව.

5. යට දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්වලට අමුනා එවිය යුතු යි. :—

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය/සහ හෝ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

(ii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත් දෙකක්. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් ගෙන් මෙම උප ශීර්ෂය යටතේ නියමිත ලියවිලි අනවශ්‍ය ය.)

සැලකිය යුතුයි :—මෙකී සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරලා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුව හොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් එවන ඉල්ලුම්පත් නියමිත දිනය ඉක්මවා ලැබුණ හොත්, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එය ලැබී ඇත්තේ නියමිත කාලසීමාව තුළ නම් හා ප්‍රමාදයට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස එය පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට මිස දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරු වලට පත්කිරීම හා අදාළ පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති
අධ්‍යක්ෂ ජනරාල්.

1965 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ 7,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දිය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**අපරදිග සංගීත වැඩ සටහන් සහායක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) 1965 සැප්තැම්බර් 10 වැනි දිනට නියම වයස :————.
   අවුරුදු :————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය :————.
4. ජාතිය :—
   (1) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පෙළපතින් ද යනවග : ————.
   (2) ලාංකිකත්වය පෙළපතින් නම් යට දැක්වෙන අය උපන් තැන් දක්වන්න :—
      (අ) අයදුම්කරු :————.
      (ආ) අයදුම්කරුගේ පියා :————.
      (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
      (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
5. අධ්‍යාපනික සහ/හෝ වෙනත් සුදුසුකම් :————.
   (ඉහත 5 (1) වැනි ඡේදයේ ප්‍රකාර සහතික පිටපත් අමුණන්න)
6. අපරදිග සංගීතය පිළිබඳ දැනුම :————.
7. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද : ————.
8. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.
9. සේවා මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යනවග :————.
   (එසේ නම් සේවයේ අස්වී යෑමේ සහතිකය හෝ වෙන යම් සාක්ෂි හෝ අමුනා එවිය යුතුයි)
10. රජය යටතේ කිසිවිටෙක සේවය කර ඇත්නම් ඒ කවදාද, කොතැනද යන්න : එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දැන්විය යුතු යි) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–917—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## දුම්රිය ස්ථානාධිපතීන්ගේ හා උප දුම්රිය ස්ථානාධිපතීන්ගේ සේවයට බඳවා ගැනීමේ විභාගය, 1965 සැප්තැම්බර්

1965 ජූනි මස 18 වැනි දින, අංක 14,427 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය සම්බන්ධයෙනි. 1965 සැප්තැම්බර් මස 11 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ පූර්වෝක්ත විභාගය 1965 සැප්තැම්බර් මස 25 වැනි දිනට කල් දමන ලදී.

ඩී. සමරකෝන්,
ප්‍රධාන පාලන නිලධාරී,
දුම්රිය දෙපාර්තමේන්තුව.

දුම්රිය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලය,
කොළඹ, 1965 අගෝස්තු මස 23 වැනි දින.

8–1041—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයට ආධුනිකයින් බඳවාගැනීම

මෙම ආයතනයට ශිෂ්‍යයින් බඳවා ගැනීම සඳහා 1965 නොවැම්බර් මස 13 වෙනි දින පවත්වනු ලබන පරීක්ෂණය සඳහා විස්තර පත්‍රිකා 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින දින දක්වා නිකුත් කරනු ලැබේ. අවශ්‍ය ඉල්ලුම් පත් 1965 ඔක්තෝබර් මස 8 වෙනි දින දක්වා නිකුත් කරනු ලබන බවත්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1965 ඔක්තෝබර් මස 22 වෙනි දින දක්වා පමණක් භාරගන්නා බවත්, විභාගාපේක්ෂකයින් වෙත මෙයින් දනුම් දෙමි.

1965 ඔක්තෝබර් මස 22 වෙනි දිනෙන් පසුව මෙම ආයතනයට ලැබෙන ඉල්ලුම් පත් භාර නොගන්නා බව විශේෂයෙන්ම සඳහන් කරමි.

කොන්දේසි ආදිය පහත සඳහන් වේ.

වැඩි විස්තර සඳහා මෙම ආයතනයේ වැඩබලන ප්‍රධාන ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

ඇල්. එච්. සුමනදාස,
වැඩබලන ප්‍රධාන ඉංජිනේරු තැන.

මූලික කාර්මික අභ්‍යාස ආයතනය,
රත්මලාන, 65.8.19.

**සුදුසුකම් හා ව්‍යවස්ථා**

1. (අ) **ශිෂ්‍යයින් බඳවාගැනීමේ දිනය වන 1966 ජනවාරි මස 1 වැනි** දිනට වයස අවුරුදු 15ටත් 16ටත් අතර විය යුතුයි;
   (ආ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි අටවැනි ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුතුයි;
   (ඇ) මෙම ආයතනයේ උපදෙස් දෙනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් බැවින් ඔවුන් ඒ වැඩකිරීම සඳහා සිංහල දැනුමක් ඇතිව සිටිය යුතුය;
   (ඈ) උස අඩි 4කුත්, අඟල් 8ක් හෝ ඊට වැඩි විය යුතුය;
   (ඉ) පපුව (නොවිහිදූ) අඟල් 27ක් හෝ ඊට වැඩි විය යුතුය;
   (ඊ) ඇස් පෙනීම ආදී ශරීර සුවයෙන් සිටිය යුතුය;
   (උ) ඉතා යසපත් කල්ක්‍රියාවෙන් යුක්ත විය යුතුය.

2. ඉහත සඳහන් සුදුසුකම්වලින් සම්පූර්ණ අයට පමණක් පහත සඳහන් ලිවීමේ පරීක්ෂණයට තම භාෂා මාධ්‍යයෙන් පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

පරීක්ෂණයට නියමිත විෂයයන්—

(අ) සාමාන්‍ය ගණිතය (අටවැනි ප්‍රමාණයට සුදුසු අන්දමට);
(ආ) කියවනවිට ලිවීම.

3. මෙම පරීක්ෂණයෙන් සමත්වන අය සම්මුඛ පරීක්ෂණයකටද පෙනී සිටිය යුතුය.

4. පරීක්ෂණාදිය සඳහා පැමිණෙන ළමයින්ගේ වියදම් කිසිවක් රජයෙන් ගෙවනු නොලැබේ.

5. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටින සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම කලින් දක්වා ඇති පරිදි, මහා නැඟල් ස්ථානාධිපතිතුමා විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්‍රිකාවක් මගින් තමන්ගේ හැඳින්වීම ඔප්පුකර සිටිය යුතුය. හැඳින්වීමේ පතක් ඉදිරිපත් නොකරන ඉල්ලුම් කරුවන්ට පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

6. මෙම ආයතනයේ සිට සැතපුම් 10ක් ඇතුළත වෙසෙන අපේක්ෂකයින්ට නේවාස පහසුකම් නොලැබෙන නමුත්, ආධුනිකයින්ට සැලසෙන අනිකුත් සාමාන්‍ය පහසුකම් ඇතුළු දිවා ආහාරය ඔවුන්ටත් සපයනු ලැබේ. යථෝක්ත දුර සීමාවෙන් පිටත වෙසෙන අපේක්ෂකයින් සඳහා නේවාස පහසුකම් සපයනු ලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ වෙනත් ආයතනවල ඇතිවන පුහුණුවන්නන්ගේ ඇබෑර්තු, මෙහි උසස් ලෙස සමත්වන ආධුනිකයින් ගෙන් පුරවනු ලැබේ. එලෙස වැඩිදුර පුහුණුව සඳහා අවස්ථාවක් ලබා දීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. එහෙත්, මෙහි පුහුණුවන සියල්ලන්ටම රක්ෂා ලබාදීමට මෙම ආයතනය බැඳී නැති බව තරයේ සිතට ගත යුතුය.

8. මෙහි ලබන මූලික පුහුණුවෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවල වැඩිදුර පුහුණුවීම සඳහා පත්වුවහොත්, ඒ අය ඇවුරුදු කාර්මික පුහුණුවන්නන් ලෙස දැනට රජයේ පඩි ක්‍රමය අනුව පැයකට ශත 17 බැගින් පඩි ලැබීමට සුදුසුවේ.

8–892—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංකය : 1/60/12 (ජී).

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය, 1964 මැයි

අංක : 14,452 හා 1965.7.16, අංක : 14,472 හා 1965.8.6 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පළවූ නිවේදනවලට අමතරවයි.

1964 මැයි මස පවත්වන ලද යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂක යන් යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| අබයරත්න, නි. ... | මූකලන් ගමුව, සීදූව. |
| අමරසිරි, හේ. ලී. ... | නො. 4/11, මැල්ඩර් පෙදෙස, නුගේගොඩ. |
| අමරසිංහ, මී. (මහත්මිය) ... | සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 535, කොළඹ 1. |
| ඇල්පේනිස්, ම. ... | මාබොදල. |
| කණ්ඩම්බි, මේ. වි. ගු. (මෙනෙවිය) | කෝදගොඩ, ඉමදූව. |
| කීර්තිචන්ද්‍ර, ර. ච. ... | " කුමුදිණී ", තලන්ගල්ල, ඕපාත, අකුරැස්ස. |
| ගමගේ, ශ්‍රී. නි. කා. (මෙනෙවිය) | " ශ්‍රී විජය ", රොන්නදූව, මිටියාගොඩ. |
| ගුණරත්න, මු. දො. සි. ... | ගෝමරකන්ද, පයියගල. |
| ගුණවර්ධන, ච. වි. ... | " සුලලිත ", වාණිජ විද්‍යායතනය, අම්බලන්ගොඩ. |
| ගුණවර්ධන, ජී. ... | " නන්දන ", නුගේතොට, ඇත්කඳුර. |
| ගුණවර්ධන, මා. ප්‍රි. (මෙනෙවිය) ... | 162ඒ, සරික්කාමුල්ල, මොරටුව. |
| ගුණසිංහ, නා. බෙ. ග. ... | නො. 68, වෙන්නවත්ත, වැල්ලම්පිටිය. |
| ගුණසිලි, ස. ම. ල. (මෙනෙවිය) ... | අංක 15ඒ, ඔරුලියැද්ද පාර, පොල්ගහවෙල. |
| ඩයස්, ඇ. ... | " දිමුතු ", වාණිජ විද්‍යායතනය, අංක 5, ජේට් වීදිය, හලාවත. |
| දයාවතී, ප. දෝ. (මෙනෙවිය) ... | විදුහල් මාවත, කුඩාවාද්දුව, වාද්දුව. |
| දයාවතී, මී. (මෙනෙවිය) ... | නො. 1, හබරකඩ, මුල්ලේගම. |
| දයාවතී, ලේ. ගු. (මෙනෙවිය) ... | රජයේ විදුලි දෙපාර්තමේන්තුව, කොළඹ දිසා කායශීලය, කොළඹ 7. |
| දසනායක, ද. මු. ක. ... | සමුපකාර සංවර්ධන උප කොමසාරිස් කායශීලය, කෑගල්ල. |
| ද සිල්වා, ක. ක. ... | " සොමිරස ", කුඩාවස්කඩුව, වස්කඩුව. |
| පරණගම, හේ. මු. පො. ... | අංක 167/4, හුලංගමුව පාර, මාතලේ. |
| ප්‍රනාන්දු, ම. බ. බා. (මෙනෙවිය) | " ශාන්ති ", බසියාවත්ත, මීගමුව. |
| ප්‍රේමරත්න, ලී. ... | බැලුම්මහර, ඉඹුල්ගොඩ. |
| මානගේ, ගා. (මහත්මිය) ... | සැපයීම් හා කොන්ත්‍රාත් අංශය, රජයේ විදුලි දෙපාර්තමේන්තුව, කොළඹ 10. |
| මාවතී හේ. ච. දො. (මෙනෙවිය) | " ලක්ෂාධිපති " මාවැල්ල ඉමදූව, ගාල්ල. |
| මැන්දිස් ම. බ. වි. ... | ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුව, කොළඹ 12. |
| විතාන, ය. (මෙනෙවිය) ... | 139, මෝදර පටුවත, දෙඩන්දූව. |
| විනීතා, ජ. ආ. (මෙනෙවිය) ... | සමාජ සේවා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 577, කොළඹ 3. |
| සිරිමතී, ම. දෝ. හ. (මෙනෙවිය) | නො. 899, පරණපාර, නාවින්න, මහරගම. |
| සෙනෙවිරත්න, ග. ... | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වගා රක්ෂණ අංශය, 22/4, ඇල්බට් චන්ද්‍රවංක, කොළඹ 7. |
| සේනාරත්න, මැ. සි. ප. (මහත්මිය.) | දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10. |
| සෝයිස්, වී. ඇ. ... | කොළඹ වරාය කොමිෂන් සභාව, කම්කරු අංශය, කොළඹ 1. |

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 20 වැනි දා,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–353—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යයන නිවාඩු සඳහා වෛද්‍ය නිලධාරීන් තේරීම—1965/66 ශාස්ත්‍රාලීය වාර

මතු සඳහන් 1වන, 2වන තීරු යටතේ පිළිවෙළින් දැක්වෙන විශේෂඥතාවයන්හි අභ්‍යාසය ලබා එහි දැක්වෙන විශේෂඥ සුදුසුකම් ලබනු පිණිස 1965 ඔක්තෝබර් මස 1 වනදාට වයස අවුරුදු 40ට අඩු II වන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. 3 වන තීරුවේ දැක්වෙන අවශ්‍යතාවයන් දැරිය යුතු අයදුම් කරුවන්, එකී අවශ්‍යතාවයන් :—

(i) දැනට ලබා හෝ,
(ii) 1965 ඔක්තෝබර් 1 වැනිදා පෙර ලැබීමට හැකිව හෝ සිටිය යුතුය.

| විශෙෂඥතාවය | සුදුසුකම් | අවශ්‍යතාවයන් | ශිෂ්‍යත්වයට ගතවන කාලය |
|---|---|---|---|
| සාමාන්‍ය වෛද්‍ය කර්මය ... | (අ) ඇම්.ආර්.සී.පී. (ලංඩන්) හෝ එක්සත් රාජධානියේ ඕනෑම මහා විද්‍යාලයක සාමාජිකත්වය | ඇම්.ඩී. (ලංකා) ... ... | අවුරුදු 2 |
| ළමා රෝග ... | ළමා රෝග වෛද්‍ය කර්ම විෂයෙහි ඇම්.ආර්.සී.පී. (ලංඩන්) හෝ (එඩින්) | එම ... | අවුරුදු 2 |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව ... | ඩී.සී.පී. හෝ ඩී.පී. හා සඳහන් කරන ලද විශේෂිත වැඩ සමග | අධිකරණ වෛද්‍ය විද්‍යාවෙහි අවුරුද්දක පළපුරුද්ද | අවුරුදු 2 |
| නිර්වින්දනය ... | (අ) ඇෆ්.ඇෆ්.ඒ.ආර්.සී.එස්. (එංග) ... | (අ) ප්‍රාථමික ඇෆ්. ඇෆ්.ඒ.ආර්.සී.එස්. පිළිගත්... රෝහලක නිර්වින්දන වැඩ හැර මාස 12 සායනික වාට්ටු පත්වීම් ලැබ සිටීම. පිළිගත් රෝහලක පූර්ණකාලීන නිර්වින්දන සේවයේ 18 මසක් පත්වීම් ලැබ සිටීම. | අවුරුදු 2 |
| | (ආ) ඩී.ඒ. (ලංඩන්) ... ... | (ආ) පිළිගත් රෝහලක සාමාන්‍ය වෛද්‍ය කර්මය හෝ සාමාන්‍ය ශල්‍ය විද්‍යාව පිළිබඳව 6 මසක නේවාසික වාට්ටු පත්වීම් ලැබීම | අවුරුදු 1½ |
| මහජන සෞඛ්‍ය ... | ඩී.පී.එච්. හෝ එම්.පී.එච්. ... ... | මහජන සෞඛ්‍ය පිළිබඳ අවුරුදු 2ක පළපුරුද්ද ... | අවුරුදු 1 |
| කන්, නාස, උගුරු ... | එෆ්.ආර්.සී.එස්. (එංග) ... ... | ප්‍රාථමික එෆ්.ආර්.සී.එස්. (එංග) කන්, නාස, උගුරු පිළිබඳ ව අවුරුද්දක සේවය | අවුරුදු 2 |
| රෝග නිදාන විද්‍යාව ... | (අ) ඇම්.ආර්.සී.පී. (ලංඩන්) හා ඩී.සී.පී. (ලංඩන්) හෝ | (අ) රෝග නිදාන විද්‍යාව පිළිබඳ අවුරුදු 2ක පළපුරුද්ද | අවුරුදු 3½ |
| | (ආ) ඇම්.ආර්.සී.පී. (ලංඩන්) හා ඩී.පී. ... | (ආ) රෝග නිදාන විද්‍යාව පිළිබඳ අවුරුදු 4ක පළපුරුද්ද | |
| රෝග නිදාන විද්‍යාව (පර්යේෂණ) ... ... | (අ) පී.එච්.ඩී. සහ ඩී.සී.පී. හෝ ... (ආ) පී.එච්.ඩී. සහ ඩී.පී. ... ... | (අ) රෝග නිදාන විද්‍යාව පිළිබඳ අවුරුදු 2ක පළපුරුද්ද (ආ) රෝග නිදාන විද්‍යාව පිළිබඳ අවුරුදු 4ක පළපුරුද්ද | අවුරුදු 4 |
| පෝෂ්‍යගුණය ... | පෝෂ්‍යගුණය විශේෂඥතාවයේ පී.එච්.ඩී. උපාධිය ... | පෝෂ්‍යගුණය විද්‍යාවේ අවුරුදු 2ක පළපුරුද්ද ... | අවුරුදු 3½ |
| සාමාන්‍ය ශල්‍ය වෛද්‍ය විද්‍යාව | ඇෆ්.ආර්.සී.එස්. ... ... | ඇෆ්.ආර්.සී.එස්. විභාගයේ ප්‍රාථමික විභාගයෙන් සමත් වී ඇෆ්.ආර්.සී.එස්. ගැනීමට සියළු තනතුරු සම්පූර්ණ කර තිබිය යුතුය | අවුරුදු 2 |

2. වෛද්‍ය නිළධාරියෙකු ලෙස සිය තනතුරෙහි ස්ථිර කර නැති අපෙක්ෂකයකු ඒ ඒ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් නියම කර ඇති දිනයන්ට හෝ 1965 දෙසැම්බර් මස 1 වෙනි දිනට ප්‍රථම හෝ සිය තනතුරෙහි ස්ථිර කළ හොත් පමණක් ශිෂ්‍යත්ව ප්‍රදානය භාරගැනීමට ඉඩදීමේ කොන්දේසිය යටතේ ශිෂ්‍යත්වයක් සඳහා තාවකාලික වශයෙන් තෝරාගත හැක.

3. එක විශෙෂඥ අංගයක් පිළිබඳ අධ්‍යයන නිවාඩු දීමට තෝරාගත අපෙක්ෂකයකුට වෙන විශේෂඥ අංශයක් පිළිබඳව පාඨමාලාවක් හැදෑරීමට ඉඩ දෙනු නො ලැබේ. අධ්‍යයන නිවාඩු අවසාන වී පෙරලා පැමිණි අපෙක්ෂකයා එම විශේෂඥ අංශයෙහිම කටයුතු කළ යුතුයි.

අධ්‍යයන නිවාඩු සඳහා තෝරාගත් නිළධාරීන්ට පහත සඳහන් වරප්‍රසාද දෙනු ලැබේ :—

(1) නියමිත කාල සීමාව් තුළ දී (ගෙවල් කුලී හැර) සම්පූර්ණ වැටුප්;

(2) රජයේ වියදමින් යැමට සහ ආපසු ඒමට යාන පත්‍ර;

(3) (පෞද්ගලික පාඨමාලා වියදම් හැර) පිළිගත් අධ්‍යයන පාඨමාලා සහ සමත් වූ විභාග පිළිබඳ වියදම්;

(4) දිවයිනේ පිටත සිටීමට බලකරන කාලය තුළ දී, භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 276 අනුව දීමනා.

4. පහත සඳහන් කොන්දේසි ඇතුළත් ගිවිසුමකට නිළධාරීන් විසින් බැඳිය යුතුයි :—

(1) සීමිත කාල සීමාවක් තුළ දී නියමිත සුදුසුකම් ලබාගැනීමට;

(2) පෙරලා දිවයිනට පැමිණීමෙන් පසු දස අවුරුද්දක් සේවය කිරීමට (සේවයෙන් නෙරපා හැරීම, සේවය දිගටම කරගෙන යැමට අපොහොසත් වීමක් ලෙස සලකනු ලැබේ);

(3) පෞද්ගලික වෘත්තියෙහි යෙදීමෙන් වැළකී සිටීමට සහ පූර්ණකාල විශේෂඥයෙක් ලෙස සේවය කිරීමට;

(4) ගිවිසුමේ සඳහන් කොන්දේසි සපුරාලීමට අපොහොසත් වූ විට රජය මගින් තීර්ණය කරනු ලබන ගණනක් ආපසු ගෙවීමට.

5. පුහුණු කරනු ලබන මධ්‍යස්ථානයන්හි ස්ථාන වෙන් කරදීම හා ඉදිමේ, පහසුකම් සලසා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රයත්නය වේ. එක්සත් රාජධානියේ තිබෙන මහ කොමසාරිස් කාර්‍ය්‍යාලය මගින් කටයුතු කිරීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් තම තමන්ගේ අවශ්‍යකම් මා වෙත දන්වන ලෙස බලාපොරොත්තු වනු ලැබේ.

6. විශේෂ සැළකිල්ලක් දැක්වීමට හේතුන් ඇතොත් ඒවාද සඳහන් කරමින් නිළධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 18 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර හැකිතාක් දුරට ස්වයං විස්තරාත්මක විය යුතුය. තවද කලින් ඒවා ඇති ඉල්ලුම් පත්‍ර අවලංගු වූවාසේ සළකන බැවින් ඒවා ගැන සඳහන් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් තව දුරටත් ලිවීමට හෝ නොකල යුතුයි. නිළධාරීන් විශේෂඥ අංශ එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් පත්‍ර එවිය හැක. විශේෂඥ අංශ එකකට වැඩි ගණනක් ඉල්ලන විට වෙන වෙනම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

ඉල්ලුම් පත්‍ර භාරගත් බව දන්වනු නොලැබේ.

වී. ටී. එච්. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

8–1030/1—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## 1965/66 වසරේ ශාස්ත්‍රාලීය සැසිවාර සඳහා රෝහල් පාලනය සම්බන්ධයෙන් අධ්‍යයන නිවාඩු දීමට වෛද්‍ය නිළධාරීන් තෝරගැනීම

රෝහල් පාලනය සම්බන්ධයෙන් සුදුසුකම් ලබාගැනීම සඳහා අධ්‍යයන නිවාඩු දීම පිණිස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලන ශ්‍රෙණියේ වෛද්‍ය නිළධාරීන්ගෙන් හා පළමුවැනි ශ්‍රෙණියේ වෛද්‍ය නිළධාරීන්ගෙන් ද ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අපේක්ෂකයා විසින් ඩී.එම්.එස්.ඒ. උපාධිය ලබාගත යුතුයි. මෙම ශිෂ්‍යත්වය සඳහා දෙනු ලබන කාල සීමාව අවුරුදු 1කි.

2. සුදුසුකම සඳහා කොන්දේසි :

(අ) නියෝජ්‍ය පාලන ශ්‍රෙණියේ වෛද්‍ය නිලධාරියෙකු හෝ පළමුවැනි ශ්‍රෙණියේ වෛද්‍ය නිළධාරියෙකු විය යුතු ය ;

(ආ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 කට නොවැඩි විය යුතු ය ;

(ඇ) අඩු වශයෙන් ඩී.ටී.එම්. සහ එච්. උපාධියවත් ලබාගෙන තිබිය යුතු ය.

3. වෛද්‍ය නිළධාරියෙකු ලෙස සිය තනතුරෙහි ස්ථිර කර නැති අපෙක්ෂකයකු ඒ ඒ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් නියම කර ඇති දිනයන්ට හෝ 1965 දෙසැම්බර් මස 1 වෙනි දිනට ප්‍රථම හෝ සිය තනතුරෙහි ස්ථිර කළහොත් පමණක් ශිෂ්‍යත්ව ප්‍රදානය භාරගැනීමට ඉඩ දීමේ කොන්දේසිය යටතේ, ශිෂ්‍යත්වයක් සඳහා තාවකාලික වශයෙන් තෝරාගත හැක.

4. මේ විශේෂඥ අංශය පිළිබඳ අධ්‍යයන නිවාඩු දීමට තෝරාගත් අපේක්ෂකයකට වෙන විශේෂඥ අංශයන් පිළිබඳ ව පාඨමාලාවක් හැදෑරීමට ඉඩදෙනු නො ලැබේ. අධ්‍යයන නිවාඩුව අවසාන වී පෙරළා පැමිණි අපේක්ෂකයා එම විශේෂඥ අංශයෙහිම කටයුතු කළ යුතුයි.

අධ්‍යයන නිවාඩු සඳහා තෝරාගත් නිළධාරීන්ට පහත සඳහන් වරප්‍රසාද දෙනු ලැබේ :—

(1) නියමිත කාල සීමාව තුළ දී (ගෙවල් කුලි හැර) සම්පූණ වැටුප්;

(2) රජයේ වියදමින් යාමට සහ ආපසු ඒමට යානපත්‍ර;

(3) (පෞද්ගලික පාඨමාලා වියදම් හැර) පිළිගත් අධ්‍යයන පාඨමාලා සහ සමත් වූ විභාග පිළිබඳ වියදම්;

(4) දිවයිනේ පිටත සිටීමට බලකරන කාලය තුළ දී, භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 276 අනුව දීමනා.

5. පහත සඳහන් කොන්දේසි ඇතුළත් ගිවිසුමකට නිළධාරීන් විසින් බැඳිය යුතුයි :—

(1) සීමිත කාලසීමාවක් තුළ දී නියමිත සුදුසුකම් ලබා ගැනීමට,

(2) පෙරලා දිවයිනට පැමිණීමෙන් පසු දස අවුරුද්දක් සේවය කිරීමට (සේවයෙන් නෙරපා හැරීම, සේවය දිගටම කරගෙන යැමට අපොහොසත් වීමක් ලෙස සලකනු ලැබේ);

(3) පෞද්ගලික වෘත්තියෙහි යෙදීමෙන් වැළකී සිටීමට සහ පූර්ණ කාල විශේෂඥයෙක් ලෙස සේවය කිරීමට;

(4) ගිවිසුමේ සඳහන් කොන්දේසි සපුරාලීමට අපොහොසත් වූවිට රජය මගින් තීරණය කරනු ලබන ගණනක් ආපසු ගෙවීමට.

6. පුහුණු කරනු ලබන මධ්‍යස්ථානයෙහි ස්ථාන වෙන් කර දීම හා ඉදීමේ පහසුකම් සලසා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රයත්නය වේ. එක්සත් රාජධානියේ තිබෙන මහ කොමසාරිස් කාර්යාලය මගින් කටයුතු කිරීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් තම තමන්ගේ අවශ්‍යකම් මා වෙත දන්වන ලෙස බලාපොරොත්තු වනු ලැබේ.

7. විශේෂ සැළකිල්ලක් දැක්වීමට හේතුන් ඇතොත් ඒවා ද සඳහන් කරමින් නිළධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 18 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර හැකිතාක් දුරට ස්වයං විස්තරාත්මක විය යුතුය. තවද කලින් එවා ඇති ඉල්ලුම්පත් අවලංගු වූවාසේ සළකන බැවින්, ඒවා ගැන සඳහන් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් තවදුරටත් ලිවීම හෝ නොකළ යුතුයි.

ඉල්ලුම් පත්‍ර භාරගත් බව දන්වනු නොලැබේ.

වී. ටී. එච්. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

8–1030/2—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## 1965-66 වසරේ ශාස්ත්‍රාලීය සැසිවාර සඳහා අධ්‍යයන නිවාඩු දීමට දන්ත ශල්‍ය වෛද්‍යවරයන් තෝරාගැනීම

දන්ත වෛද්‍ය සුදුසුකම් ලබාගැනීම සඳහා අධ්‍යයන නිවාඩු දීම පිණිස, 1965 ඔක්තෝබර් 1 වැනි දිනට වයස අවුරුදු 40 කට නොවැඩි දන්ත ශල්‍ය වෛද්‍යවරයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අපේක්ෂකයා විසින් එෆ්. ඩී. එස්. ආර්. සී. එස්. උපාධිය ලැබගත යුතුය. මෙම ශිෂ්‍යත්වය සඳහා දෙනු ලබන කාලසීමාව අවුරුදු 2 කි.

2. සුදුසුකම සඳහා කොන්දේසි—

(අ) ප්‍රාථමික එෆ්. ඩී. එස්. විභාගයෙන් සමත් පළමුවැනි ශ්‍රේණියේ හෝ දෙවැනි ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙක් විය යුතුය;

(ආ) 1965 ඔක්තෝබර් 1 වැනි දිනට වයස අවුරුදු 40 කට නොවැඩි විය යුතුය.

3. දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරියකු ලෙස සිය තනතුරෙහි ස්ථිර කර නැති අපේක්ෂකයකු ඒ ඒ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් නියම කර ඇති දිනයන්ට හෝ 1965 දෙසැම්බර් මස 1 වෙනි දිනට ප්‍රථම හෝ සිය තනතුරෙහි ස්ථිර කළ හොත් පමණක් ශිෂ්‍යත්ව ප්‍රදානය භාරගැනීමට ඉඩදීමේ කොන්දේසිය යටතේ, ශිෂ්‍යත්වයක් සඳහා තාවකාලික වශයෙන් තෝරාගත හැක.

4. මේ විශේෂඥ අංශය පිළිබඳ අධ්‍යයන නිවාඩු දීමට තෝරාගත් අපේක්ෂකයකුට වෙන විශේෂඥ අංශයක් පිළිබඳව පාඨමාලාවක් හැදෑරීමට ඉඩ දෙනු නො ලැබේ. අධ්‍යයන නිවාඩු අවසානවී පෙරලා පැමිණි අපේක්ෂකයා එම විශේෂඥ අංශයෙහිම කටයුතු කළ යුතුයි.

අධ්‍යයන නිවාඩු සඳහා තෝරාගත් නිළධාරීන්ට පහත සඳහන් වරප්‍රසාද දෙනු ලැබේ :—

1. නියමිත කාල සීමාව තුළ දී(ගෙවල් කුලී හැර) සම්පූර්ණ වැටුප්,
2. රජයේ වියදමින් යැමට සහ ආපසු ඒමට යාන පත්‍ර,
3. (පෞද්ගලික පාඨමාලා වියදම් හැර) පිළිගත් අධ්‍යයන පාඨමාලා, සහ සමත්වූ විභාග පිළිබඳ වියදම්,
4. දිවයිනේ පිටත සිටීමට බලකරන කාලය තුළදී, භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 276 අනුව දීමනා.

5. පහත සඳහන් කොන්දේසි ඇතුළත් ගිවිසුමකට නිළධාරීන් විසින් බැඳිය යුතුයි :—

1. සීමිත කාල සීමාවක් තුළ දී නියමිත සුදුසුකම් ලබාගැනීමට;
2. පෙරලා දිවයිනට පැමිණීමෙන් පසු දස අවුරුද්දක් සේවය කිරීමට, (සේවයෙන් නෙරපා හැරීම, සේවය දිගටම කරගෙන යැමට අපොහොසත්වීමක් ලෙස සලකනු ලැබේ);
3. පෞද්ගලික වෘත්තියෙහි යෙදීමෙන් වැලකී සිටීමට සහ පූර්ණ කාල විශේෂඥයෙක් ලෙස සේවය කිරීමට;
4. ගිවිසුමේ සඳහන් කොන්දේසි සපුරාලීමට අපොහොසත්වූ විට රජය මගින් තීරණය කරනු ලබන ගණනක් ආපසු ගෙවීමට.

6. පුහුණු කරනු ලබන මධ්‍යස්ථානයන්හි ස්ථාන වෙන් කරදීම හා ඉදීමේ පහසුකම් සලසා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රයත්නය වේ. එක්සත් රාජධානියේ තිබෙන මහ කොමසාරිස් කාර්යාලය මගින් කටයුතු කිරීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් තම තමන්ගේ අවශ්‍යකම් මා වෙත දන්වන ලෙස බලාපොරොත්තු වනු ලැබේ.

7. විශේෂ සැලකිල්ලක් දැක්වීමට හේතූන් ඇතොත් ඒවාද සඳහන් කරමින් නිළධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 18 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර හැකිතාක් දුරට ස්වයං විස්තරාත්මක විය යුතුය. තවද කලින් එවා ඇති ඉල්ලුම් පත්‍ර අවලංගු වූවාසේ සලකන බැවින් ඒවා ගැන සඳහන් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් තව දුරටත් ලිවීම හෝ නොකළ යුතුයි.

ඉල්ලුම් පත්‍ර භාරගත් බව දන්වනු නොලැබේ.

වී. ටී. එච්. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

8–1030/3—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඇළුමිනියම් භාණ්ඩ සැපයීම

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1965.8.31 නොව, 1965.9.14 බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකන්න.

1965.8.27,
කොළඹ දීය.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

8–1037—65. 8. 27 දින අංක 14,490 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1), 1965.10.1 සිට 1966.3.31 තෙක් ගඟේ වැලි ආදිය සැපයීම සඳහා 1965 සැප්තැම්බර් 14 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන් සියක් ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් 13 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965 අගෝස්තු 27 වැනි දින,
කොළඹ දීය.

8–1046—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

නූල් කැඳ දමන රසායන ද්‍රව්‍ය ටොන් 100 ක් සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් සහ ඔවුනගේ නියෝජිතයන්ගෙන් ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 65.10.15 දින පෙ.ව. 9.30 දක්වා මිළ ගණන් පත්‍ර බාර ගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සඳහා ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත වැ. බ. අධ්‍යක්ෂ.

1965.8.23,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේදීය.

8–1035—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් පාරේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ, ගුවන් හමුදපති විසින්, කටුනායක, සැපයීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ තිබෙන පහත සඳහන් සුන්බුන් වෙන් වෙන් වශයෙන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් වර්ෂ 1965 සැප්තැම්බර් 14 වැනි දින පෙරවරු 10.00 දක්වා බාරගනු ලැබේ:—

| | | |
|---|---|---|
| (අ) හම් (සුන්බුන්) | ... | ... රාත්තල් 224 පමණ |
| (ආ) පරණ බැටරි | ... | ... 83 යි |
| (ඇ) පරණ රබර් | ... | ... රාත්තල් 7,000 පමණ |
| (ඈ) පරණ කැන්වස් | ... | ... රාතත්ල් 650 පමණ |
| (ඉ) ගෝනි, ලොකු | ... | ... 300 |
| (ඊ) බෝතල්, හිස් | ... | ... 300 |
| (උ) ගැලුම් 4 හිස් ටින් (බෙලෙක්) | ... | ... 165 |
| (ඌ) ගැලුමේ හිස් ටින් | ... | ... 455 |

2. ටෙන්ඩර් පත්‍රයක් ලබා ගැනීම පිණිස කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත රුපියල් පණහක (රු. 50.00) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. වර්ෂ 1965 සැප්තැම්බර් මස 13 වැනි දින පස්වරු 12.00 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. සියළුම ටෙන්ඩර් පත් අනු පිටපත සමග මුද්‍රා තබන ලද කවරයක බහා, කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ '' සුන්බුන් මිළයට ගැනීම සඳහා ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කර කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ගුවන් හමුද මූලස්ථානයේ, ගුවන් හමුදධිපති වෙත එවිය යුතුයි. එක් එක් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මිළ ගණන් දක්විය යුතුයි. තවද එකිනෙක ද්‍රව්‍යයන් වෙනුවෙන් වූ වැඩිම ඉල්ලුම් කරුගේ මිළ ගණන් පිළිගනු ලැබේ.

4. පළමුවැනි ඡෙදයේ සඳහන් කර ඇති ස්ථානයේදී, දිනයේදී හා වේලාවේදී ටෙන්ඩර් පත විවෘත කරන විට ටෙන්ඩර් ඉදිරිපත් කළ සියළු දෙනාටම පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. ටෙන්ඩර් පතක් ඉදිරිපත් කරන ලද කෙනෙකුට ටෙන්ඩර් පතක් පරීක්ෂා කිරීමට කැමැත්තක් තිබේ නම් ගුවන් හමුදධිපතිට එය දැන්වූ විට ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක අනුපිටපත පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු,
ගුවන් හමුදධිපති.

8-1042—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## 1965-66 මුදල් වර්‍ෂය තුළ යාපනය බන්ධනාගාරයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මා විසින් යාපනය බන්ධනාගාරයට 1965-66 මුදල් වර්‍ෂය තුල මාදම්පේ වේවැල් (සිංහල වැල්), පොල් කටු අඟුරු සහ පිරාපු කොහු සැපයුම සඳහා වූ ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් මස 17 වෙනිද පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

3. මේ ටෙන්ඩර් සඳහා ටෙන්ඩර් හා ඇරක්ෂණ තැන්පත් මුදල් පිළිවෙලින් රු. 20 සහ රු. 250 මාදම්පේ වේවැල් සඳහාද, රු. 10 සහ රු. 25 පොල් කටු අඟුරු හා පිරාපු කොහු සඳහා ද විය යුතුයයි තීරණය කොට ඇත.

4. ඉහත සඳහන් ද්‍රව්‍යය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කෙරේ නම් ඒ වෙනුවෙන් ආදර්ශක (සැම්පල්) ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියාවුණු වෙනම ලියුම් කවරයක බහා පහත අත්සන් කරණු ලබන අයගේ කායාීලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැති ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරණු ඇත.

5. පහත සඳහන් ආයතනයන් සඳහා නියමිත ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන තැන්පත් ඇප මුදල් අවශ්‍ය නොවේ :—

(1) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(2) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
(3) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(4) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් විසින් ලියාපදිංචි කරණ ලද සමූපකාර සමිති.

6. ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහාම නියමිත ෆෝර්මයක් මගින් පමණකි. ඒ ලබාගත හැක්කේ 1965 සැප්තැම්බර් මස 16 වෙනි දින පස්වරු 3 දක්වා පමණක් පිළිගනු ලබන ඉහත සඳහන් ද්‍රව්‍යය සඳහා වෙන වෙනම සඳහන් කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර කොමසාරිස් කායාීලයේදීත්, කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දීත් තැන්පත් කළ හැකි බවත්, සලකවනු ලැබේ.

7. ටෙන්ඩර්පත්‍රයන් සීල් තැබූ කවරයන් හි බහා එහි වම්පස කෙළවර ''...................................සැපයීම සඳහා ටෙන්ඩරය'' යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කායාීලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැකිය.

8. නියම කරණ ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන් හි අකුරෙන් හා ඉලක්කම් වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනසක් කිරීම් හෝ අමුතු එක් කිරීම් ඇතුලත් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බව සහතික කළ යුතුය.

9. වර්‍ෂ 1965 සැප්තැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10.40ට පහත අත්සන් කරන ලද අයගේ කායාීලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

10. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය යාපනය බන්ධනාගාර අධිකාරී වෙත පැවරී ඇත.

11. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ විට දින 10ක් ඇතුලත දී යාපනය බන්ධනාගාර අධිකාරී සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුයි. එම කාලසීමාව තුල දී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් එම කාලසීමාව තුලදී ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

12. වැඩි විස්තර දැන ගැනීමට ඇවැසි නම් පහත අත්සන් කරන අයගෙන් ඒ ලබාගත හැක.

ඒ. ඥාණසුන්දරම්,
බන්ධනාගාර අධිකාරී, යාපනය.

බන්ධනාගාරය, යාපනය,
1965 අගෝස්තු 21 දින,

8-1028—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 නොවැම්බර් මස 3 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ක්‍රෝලරයක නංවන දොඹකරයක් සහ ඩීසල් ජංගම දොඹකර දෙකක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1965 නොවැම්බර් මස 3 වෙනිදා පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් හා රු. 15 ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභා කාර්යාලයේදී තැන්පත්කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත්කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ලියකියවිලි ගාස්තු වශයෙන් තැන්පත් කරන රු. 15 ආපසු ගෙවනු නොලැබේ.

3. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත්කළ යුතුය. 1965 නොවැම්බර් මස 1 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත්කරනු ලැබේ.

4. අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි හෝ විස්තර සටහන් පත්‍රිකා නිකුත් කරනු නොලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965.8.27 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායාීලයේදීය.

8-984—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍යයන් සැපයුම—1965/66

පහත අත්සන් කරනු ලබන මවිසින් කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1965/66 මුදල් වසර තුලදී, පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා වූ ටෙන්ඩර් 1965 සැප්තැම්බර් 17 ද පෙරවරු 10.30 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

3. ටෙන්ඩර හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයැයි තීරණය කොට ඇත :—

| | සැපයුම් | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. | ආරක්ෂක තැන්පත් මුදල් රු. |
|---|---|---|---|
| (1) | රබර් පතුල් (අඟල් 5 සිට 10 දක්වා ප්‍රමාණයෙන් මුලු යටි පතුල සඳහා මය) ... ... ... | 10 | 100 |
| (2) | රබර් විලුම් (අඟල් 25 6 සිට 4 දක්වා වූ ප්‍රමාණයයන්) ... ... ... ... | 10 | 100 |
| (3) | මාදම්පා වේවැල් (වේවැල් වැඩ සඳහා සුදුසුවා වියයුතුයි) ... ... ... ... | 20 | 200 |
| (4) | මුස්න මීටි (දිගින් අඩි 5ට නොඅඩු, මේරූ සවිමත් කෙලින් ලී විය යුතුයි. දවට, ඇට්ටේරියා, කැබැල්ල, සුදුසුසේ ගැනේ)... | 10 | 100 |
| (5) | පිරිසිදු ඉරටු (සම්පූර්ණ දිගැති, මේරූ වියලි ඒවා විය යුතුයි) ... ... ... ... | 10 | 100 |
| (6) | ගුදිරි කොහු (ගුදිරි සැදීමට සුදුසු විය යුතුයි) ... ... ... ... ... | 10 | 100 |
| (7) | පිරවූ කොහු (මුසුනු හා බුරුසු සැදීමට සුදුසු වියයුතු) ... ... ... ... | 10 | 100 |
| (8) | පොල්කටු අඟුරු (මද පමණට දවුනු දුවිලින් තොරවූ ඒවා විය යුතුයි) ... ... ... | 10 | 100 |
| (9) | බේකරි මුහුන් (සීල් කොට ඇසුරූ විත්) ... ... ... ... ... | 20 | 200 |

4. ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර ඉදිරිපත් කෙරේ නම් ඒ වෙනුවෙන් ආදර්ශක ටෙන්ඩරකරුගේ නම් හා ලිපිනය ලියැවුනු වෙනම ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්යාලයේ තැන්පත් කල යුතුය. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත. රබර් පතුලු හා විලුම් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ආදර්ශක හා සමග විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණය ලංකා ආයතනය මගින් නියමිත ප්‍රමාණයන්ට ඒ සරිලන බවට සහතික කෙරෙන වි. කා. ප. ල. ආයතනයේ අධ්‍යක්ෂගෙන් ලබාගත් සහතිකයක් ද අමුනා එවිය යුතුයි.

5. පහත සඳහන් ආයතනයන් සඳහා නියමිත ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමේදී ආපසු ගෙවන තැන්පත් ඇප මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම ස වර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති හා ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

6. ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුත්තේ, ඒ සඳහාම නියමිත ෆෝරමයක් මගින් පමණකි. ඒ ලබාගත හැක්කේ 1965 සැප්තැම්බර් මස 16 වෙනිද පස්වරු 2 දක්වා පමණක් පිළිගනු ලබන ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන වෙනම සඳහන් කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කොට ලබාගත් රිසිට්පතක් ඉදිරිපත් කිරීමෙන් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල්, කොළඹ 9, බන්ධනාගාර කොමසාරිස් කාර්යාලයේදීත්, කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළහැකි බවත් සලකටනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරේ " අමු ද්‍රව්‍යයන් සැපයුම් සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළ හැකිය.

8. නියම කරන ලද මිල ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් හෝ ඉලක්කම් වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනසක් කිරීම හෝ අමුණු එක් කිරීම ඇතුළත් කළ හොත් ඒ බව ටෙන්ඩර් කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බව සහතික කළ යුතුයි.

9. වර්ෂ 1965 සැප්තැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

10. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවකදී නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරී වෙත පැවරී ඇත.

11. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ විට දින 10ක් ඇතුළත දී බන්ධනාගාර කර්මාන්ත අධිකාරී සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුයි. එම කාල සීමාව තුලදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් එම කාල සීමාව තුලදී ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

12. තවත් වැඩි විස්තර දන ගැනීම ඇවැසිනම්, පහත අත්සන් කරන අයගෙන් ඒ ලබාගත හැකිය.

ආර්. ජේ. ඇන්. ජෝඩන්,
වැඩ. බ. බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 9,
1965 අගෝස්තු මස 21 වෙනි දින.

8–1027—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### එලිසබෙත් රැජින වේදිකාවේ පිහිටි අංක 3 දරණ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට සයෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965.9.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරම්වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝරම් ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1965.9.15 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝරම් සමග නිකුත් කරනු ඇත.

8–1019—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ඩොක් වේදිකාවේ පිහිටි තේ කඩය

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත තේ කඩය බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965.9.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1965.9.15 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

8–1017—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### විජය කුමාර වේදිකාවේ පිහිටි ආපනශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965.9.17 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1965.9.15 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

8–1018—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ දකුණු ඉවුරු අතු ඇල අංක 3 නේ 4 වන සැතපුම කැපීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 17) සඳහා ටෙන්ඩර් පත් 65.9.21 වෙනි දින පෙ. ව. 10 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 30,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස්කළ හැක.

3. 1965.9.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායසීලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු,
රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාර්ග කායසීලය, රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 1965. 8. 19 වැනි දින,

8–945—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ දකුණු ඉවුරු අතු ඇල අංක 3 නේ 3 වන සැතපුම කැපීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 16) සඳහා ටෙන්ඩර් පත් 65.9.21 වෙනි දින පෙ. ව. 10 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 30,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කල හැක.

3. 1965.9.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස්කල යුතුයි.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායසීලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු,
රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාර්ග කායසීලය, රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 1965. 8. 19 වැනි දින.

8–947—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව — නිකවැරටිය උ. කො.

නිකවැරටිය උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටැන්ඩර් පත් 1965.9.14 වැනි අඟහරුවාද පෙරවරු 10 දක්වා, වයඹ පළාතේ, කුරුණෑගල, ප්‍රාදේශීය වාර්මාරිග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ:—

| | සේවා විස්තර | උවමනා ලියා පදිංචිවූ ප්‍රමාණය රු. | | ටැන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 1. | මහඅන්දරවැව වාරිමාර්ග පහසුකම් සැළසීම | 25,000 | ... | 25 |
| 2. | ඉහළ නාන්නේරියවැව වැඩිදියුණු කිරීම | 30,000 | ... | 50 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩය සඳහා ටැන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

වර්ෂ 1965.9.10.වැනි සිකුරාද වනතෙක් (එදින ඇතුළුව) කායර්‍යාලීය වේලාවන් තුළදී නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු කායර්‍යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොළ සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබෙද නැද්ද යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම කොළ නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් පරිදි තැන්පත් මුදල් වෙන් වෙන් වශයෙන් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මේ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැළසුම් ආදී විස්තර කායර්‍යාල වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු, නිකවැරටිය උ. කො.

1965 අගෝස්තු 14 වන දින,
නිකවැරටියේ දී ය.

8—854—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතලේ උප කොට්ඨාශය

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් මස 15 වැනි බුද දින පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ :—

| වැඩය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| (1) මහනුවර-අනුරාධපුර පාරේ 40½ සැතපුම් කනුව අසළ දඹුලු ඔය හරහා අමුණක් බැදීම ... ... | පුහුණු වැඩ සඳහා රු. 30,000 ට හෝ ඊට වැඩි මුදලකට. |
| (2) මාතලේ දිස්ත්‍රික්කයේ නබරල වැව ව්‍යාපාරය යටතේ වම් ඉවුරේ ප්‍රධාන ඇල සෑදීම ... | පුහුණු වැඩ සඳහා රු. 25,000 ට හෝ ඊට වැඩි මුදලකට. |

2. ඉහත සඳහන් වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති.

1965 අගෝස්තු මස 28 වෙනි දින සිට 1965 සැප්තැම්බර් මස 13 වෙනි දින දක්වා කායර්‍යාල වේලාවන් තුළදී, මාතලේ, මහනුවර, හසලක, මිනිපේ සහ නුවරඑළිය වාරිමාර්ග ඉංජිනේරු කායර්‍යාලවලින් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් අංක (1) යටතේ වැඩය සඳහා රු. 50ක්ද, අංක (2) යටතේ වැඩය සඳහා රු. 25ක් ද මුදල් තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කායර්‍යාලයේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක තැන්පත්කොට, ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යයය.

මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර කායර්‍යාල වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැකිය.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතලේ උප කොට්ඨාශය.

වාරිමාර්ග කායර්‍යාලය,
මාතලේ,
1965 අගෝස්තු මස 16 වැනි දින දීය.

8–893—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පුත්තලම උප කොට්ඨාශය

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 14 වෙනි අඟහරුවාද පෙ.ව. 10 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

| | වැඩෙහි නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වියයුතු ගණන රු. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| (1) | දෙපාර්තමේන්තු මාවත් අළුත්වැඩියා කිරීම. වටරවුම් පාර 1 වැනි සැතැප්ම තබ්බෝව ව්‍යාපාරය ... | 22,000 | ... | 25 |
| (2) | දෙපාර්තමේන්තු මාවත් අළුත්වැඩියා කිරීම. අවටරවුම් පාර 2 වැනි සැතැක්ම තබ්බෝව ව්‍යාපාරය... | 22,000 | ... | 25 |
| (3) | දෙපාර්තමේන්තු මාවත් අළුත්වැඩියා කිරීම. වටරවුම් පාර 3 වැනි සැතැක්ම තබ්බෝව ව්‍යාපාරය ... | 22,000 | ... | 25 |

2. ඉහත දක්වෙන එක් එක් වැඩය සඳහා පෙන්නුම් කරන ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඒ ඒ වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. වර්ෂ 1965 සැප්තැම්බර් මස 9 වෙනි බ්‍රහස්පතින්ද (එදින ඇතුළුව) කායර්‍යාලීය වේලාවන් තුළ දී පුත්තලම උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළුම විස්තර, කායර්‍යාලීය වේලාවන් තුළ දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

මු. මො. සිවප්‍රගාසම්,
පුත්තලම උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කායර්‍යාලය,
පුත්තලම. 1965.8.18

8—935—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනතේ (117 වන පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට පවරාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතුව පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර පේරාදෙණියේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් හෝ එම ගොවිපල භාර කළමනාකරුගෙන් දැන ගත හැකිය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 17 වැනි දින,
පේරාදෙණියේ දී ය.

8-911—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## කැකිරාවේ යන්ත්‍ර මගින් රෙදි වියන කර්මාන්ත ශාලාවට විදුලිය පිහිටුවීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 26 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දිය යුතුයි. පිට කවරයේ ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය සහ සේවයේ විස්තරද සඳහන් කොට ටෙන්ඩර් මණ්ඩලයේ ටෙන්ඩර් භාර ගැනීමේ බලයලත් සභාපති තැනට භාර දිය යුතුයි.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන්ගේ කාර්යාලයේදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තු වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 22 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 26 වන අඟහරුවාදා පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇස්. ඩබ්ලිව්. පීරිස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැඩ බලන ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ 10
1965 අගෝස්තු 27 වෙනි දින දීය.

8-878—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත්කරුවන් හැටියට ලියා පදිංචි වී ඇති අනිකුත් සමුපකාර හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(1) දඹුවාන ඇල අළුත්වැඩියා කිරීම—යටලමත්ත.
(2) ඉහළකන්ද ඇල අළුත්වැඩියා කිරීම—අළුත් තානායම්ගොඩ ඉහළ.
(3) මිල්ලගහවිට එළිය බැම්ම තැනීම—අළුත් තානායම්ගොඩ පහළ.
(4) හත්තක අමුණ පයිප්ප බෝක්කු තැනීම.
(5) මානන අමුණ අළුත්වැඩියා කිරීම—පෝද්දිවල.
(6) අබේකෝන් අමුණ වැඩිදියුණු කිරීම—පෝද්දිවල.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළයුත්තේ ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 අගෝස්තු 30 දින සිට 1965 සැප්තැම්බර් 13 වෙනි දින දවල් 12 දක්වා, ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැන්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලව ද, නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන් වල සංශෝධනයන් කර තිබේනම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර අත්සන්කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවර වල බහා ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ ලිපිනයට යැවිය යුතුයි. ටෙන්ඩරය එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1965.9.14 දින දවල් 12ට පෙර ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැනට ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටිය"ට දැමිය යුතුය.

තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දින දහයක් ඇතුලතදී එම ටෙන්ඩර්කරු විසින් ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුයි. ගිවිසුම් අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව, කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යැයි හැඟෙනහේතූන් උඩ, ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්‍යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්‍ෂා කර බැලීමට ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා, ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්‍ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්‍යාලීය වේලාවන් තුළදී ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින, ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජනසේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1965.9.15 වෙනි දින ප. ව. 3ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරිතැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්‍ෂා කිරීමට වුවමනා නම් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඊ. එස්. ගුණතිලක,
ගොවිජනසේවා සහකාර කොමසාරිස්,
ගාලු දිස්ත්‍රික්කය.

ගාලු දිස්ත්‍රික්කයේ
ගොවිජනසේවා කාර්‍යාලයේදීය,
1965.8.18.

8–885—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### කිරි පිටි විකිණීම

කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයෙහි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් යෝදය ඉවත් කළ කිරි පිටි ටොන් 9 හෝ ඉන් කොටසක් හෝ මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් 1965 සැප්තැම්බර් මස 20 දින පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. මෙම කිරි ඕලන්දයේ නිෂ්පාදනය කරන ලද්දකි. තවද, ඕලන්ද රජය එහි වර්ගය ගැන හා සෞඛ්‍යදායකත්වය ගැන සහතික කර ඇත.

3. මෙම කිරි මනාකොට පිරිවැසුම් කළ රාත්තල් 5හේ ටින්වල අසුරා ඇති අතර ඒවා ඇත්තේ රත්මලානේ පිහිටි ආහාර කොමසාරිස්වරයාගේ ගබඩාවේය.

4. ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂතැනගෙන් 65.9.19 දින දවල් 12 වනතෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්‍යාලයෙන් හෝ ලංකා බැංකුවේ (යෝක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගේ අංක 1 දරණ ගිනුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැන්මට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් පෝර්ම බහාලූ කවරය මුද්‍රා තබා එහි උඩ වම් කෙලවරේ "කිරි පිටි විකිණීම මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එව්ය යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ තමා විසින් ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදී ලැබුන බව හැඟවීමේ කුවිතාන්සියක් ලබ්ගාත යුතුයි. එසේ නැතහොත් ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාමරයෙහි ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කල යුතුය.

6. කොළඹ එච්ලන් චතුරශ්‍රයේදී 65.9.20 දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් කිරීමට අපේක්‍ෂා කරන්නන් විසින් එසේ කිරීමට ප්‍රථමයෙන් ඔවුන්ට එම ද්‍රව්‍ය පරීක්‍ෂා කිරීමට අවශ්‍යනම්, ඒ ගැන අවසරය කොළඹ කොටුවේ චාමස් ධාන්‍යාගාරයේ සහකාර ආහාර කොමසාරිස්වරයාගෙන් ලබාගත යුතුයි.

8. ටෙන්ඩර් කරනු ලබන ප්‍රමාණය රාත්තල් 5ගේ ටින් එකක ගාස්තු ප්‍රමාණය වශයෙන් හෝ එහි සමූහ ප්‍රමාණයක් වශයෙන් හෝ දැක්විය යුතුය.

9. සාර්ථකවූ ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ දින සිට දින 10 ක් ඇතුළතදී ටෙන්ඩර් කල මුදල ගෙවිය යුතුයි. ඊටපසු දින 14 ක් ඇතුළතදී ගන්නා ලද කිරි පිටි ප්‍රමාණයන් අස්කර ගත යුතුයි. නියමිත කාලය තුළදී අස් කරගනු නොලබන සියළුම කිරි පිටි ප්‍රමාණයන් නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලබන අතර, යම්හෙයකින් ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂගේ තීරණයක් මත හෝ ටෙන්ඩර්කරු විසින් පිළිගත හැකි කරුණු ඉදිරිපත් කිරීමෙන් හෝ වෙනසක් ඇති නොකලහොත් ඒ සඳහා ටෙන්ඩර්කරුට ඇති සියළුම අයිතිකම් අහිමිවේ. තවද, ටෙන්ඩර්කරු සවකීය කොන්ත්‍රාත්තුව පැහැර හැරියහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවෙනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේය.

10. ටෙන්ඩර්කරුවන්ට මුළු කිරිපිටි ප්‍රමාණය වූ ටොන් 9ට හෝ ඉන් කොටස් වශයෙන් හෝ ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර, ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාරගැන්මේ හෝ නොගැන්මේ අයිතිය රජය සතුය.

ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ.

1965 අගෝස්තු මස 21 දින,
කොළඹ 1,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

8–964—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට 1965.10.1 සිට 1966.9.30 දක්වා වන කාලය සඳහා පහත සඳහන් ප්‍රවාහන සේවාවන් සැපයීමට ටෙන්ඩර් ඉල්ලුම් පත් 1965 සැප්තැම්බර් 21 වැනි අඟහරුවාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ :—

(1) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත්, බිබිලේ, මොණරාගල හා බුත්තල පිහිටි එළවළු ඇහිරීමේ ගබඩාවල සිට සහ බඩල් කුඹුර හා වැල්ලවාය විවිධසේවා සමුපකාර සමිති වලට අයත් මධ්‍යස්ථානවල සිට එළවළු සහ පළතුරු කොළඹ මරදානේ පිහිටි ට්‍රිපොලි වෙළඳ සැලට ප්‍රවාහනය කිරීම.

(2) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ට්‍රිපොලි වෙළඳ සැලේ පිහිටි වියලි කුළුබඩු ගබඩාව නාරාහේන්පිට පිහිටි ටින් කෑම අංශය සහ සමුපකාර තොග වෙළඳ ආයතනයේ සිට ටින් කෑම හා කුළු බඩු මොණරාගල පිහිටි ලංකා නිෂ්පාදන වෙළඳ හලට ප්‍රවාහනය කිරීම.

(3) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් තිස්ස හා තංගල්ලේ පිහිටි එළවළු ඇහිරීමේ මධ්‍යස්ථානවල සිට ගාල්ලේ හා හම්බන්තොට පිහිටි ලංකා නිෂ්පාදන වෙළඳ හල් වලට මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට සහ නාරාහේන්පිට පිහිටි ටින් කිරීමේ කර්මාන්තායතනයට එළවළු, පළතුරු, පොල්, පැනි සහ හකුරු ප්‍රවාහනය කිරීම.

(4) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් තංගල්ලේ පිහිටි ආයතනයේ සිට මාතර, ගාල්ල, පානදුරේ හා මොරටුවේ පිහිටි ලංකා නිෂ්පාදන හල් වලට සහ මරදානේ ,ත්‍රිපොලි වෙළඳ හලට මී කිරි සහ කෙසෙල් ගෙඩි ප්‍රවාහණය කිරීම.

(5) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් පුත්තලමේ පිහිටි එළවළු ඇහිරීමේ මධ්‍යස්ථානයේ සිට එළවළු, පළතුරු හා බිත්තර යනාදිය මරදානේ ත්‍රිපොලි වෙළඳ හලට ප්‍රවාහනය කිරීම.

(6) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් පුත්තලමේ ආයතනයේ සිට පුත්තලමේ මහ රෝහලට, ලය රෝහලට සහ පුත්තලමේ සුමුපකාර සංගමයේ සිට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනයට සහ එහි සිට පුත්තලමේ දුම්රිය පොලට, කුරුණෑගල පාරේ එස්. ඊ. එම්. අසන් කුඩෝස් වෙත එළවළු, පළතුරු පිටපළාත් වලින් ලැබෙන පාර්සල්, වියලි ද්‍රව්‍ය, හාල්, බිත්තර යනාදිය ප්‍රවාහනය කිරීම.

(7) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයිති මැතලේ පිහිටි එළවළු ඇහිරීමේ මධ්‍යස්ථානයේ සිට එළවළු හා පළතුරු මරදානේ ත්‍රිපොලි වෙළඳ හලට ප්‍රවාහනය කිරීම.

(8) කන්කසන්තුරේ දුම්රිය පොලේ සිට කන්කසන්තුරේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ රෝහල් සැපයීම් ශාඛාවට සහ එහි සිට කන්කසන්තුරේ රෝහල් වලට, තෙල්ලිපලෙහි සමුපකාර සංගමය සහ කන්කසන්තුරේ දර ශාඛාවේ සිට රෝහල් සැපයීම් ශාඛාවට එළවළු, වියලි ද්‍රව්‍ය හා හාල් කුළුබඩු, දර සහ වෙනත් දේ ප්‍රවාහනය කිරීම.

2. කොළඹ, කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1965 සැප්තැම්බර් 21 වැනි අඟහරුවාදා දහවල් 12 වන තුරු අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

3. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

පී. එච්. ඩී. විජේසූරිය,
වැඩබලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8–926—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ මැකලම් පාරේ පිහිටි ප්‍රවාහන අංශයේ තිබෙන පාවිච්චි කළ මෝටර් රථ කොටස් රාශියක් මිළදී ලබාගැනීම පිණිස ටෙන්ඩර් පත් කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ සථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1965 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ කොටුවේ චැතැම් විදියේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට හෝ රුපියල් 100ක් බැඳ ලබාගන්නා ලද කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

3. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

පී. එච්. ඩී. විජේසූරිය,
වැඩ බලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 20 දා,
කොළඹ 1,
62 චැතැම් වීදිය,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

8–920—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### මින්නේරිය ඔය හරහා මහා පාලමක් සෑදීම

සිංහල පත්තු ගම් සභාවේ මින්නේරිය ඔය හරහා මහා පාලමක් සෑදීම සඳහා 1965 සැප්තැම්බර් මස 27 වැනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ. ආකෘති පත්‍ර මගෙන් ලබාගත හැකිවූ මෙම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කර සිටිය යුතුය. මෙම ටෙන්ඩර් ගාලු මුවදෙර මහා ලේකම් කාර්‍යාලයේ අංක 264 දරන කාමරයේ දී යථොක්ත දිනයෙහිම පෙරවරු 10 ට විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටිය හැකිය.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබනුයේ 1965 සැප්තැම්බර් මස 23 වැනි දින පස්වරු 3 දක්වාත් රු. 75,000 කට වඩා අඩු නොවන වටිනාකමක් ඇති කර්මාන්ත සම්බන්ධයෙන් රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී සිටින බවට සාක්ෂිත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක රුපියල් 200 ක් තැන්පත් කොට ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියකුත් ඉදිරිපත් කර සිටින අයටත් පමණය.

3. සියලු ටෙන්ඩර්, ඒවා ඉදිරිපත් කරන කවරයේ වම් කෙළවරේ මුදුනෙහි "මින්නේරිය ඔය හරහා මහා පාලම සඳහා වූ ටෙන්ඩර යයි" යනුවෙන් ලකුණු කොට සීල් තබා රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. නැතහොත්, ගාලු මුවදොර, මහා ලේකම් කාර්‍යාලයේ අංක 264 දරන කාමරයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

ඩී. රාජේන්ද්‍ර,
පළාත් පාලන කොමසාරිස්.

1965 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

8–833—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කොළඹ රෝහල් මණ්ඩලය—කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වන දායින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමු වැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කම් විස්තරය.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවට ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුව.ක් මෙන් ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මැහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ ම විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචිකළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලෙඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශෙෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේ ය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිළධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂ බීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යැමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙන යැමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඩී. ඒ. ජයසිංහ,
කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී.

කො. රෝ. ම. අධිකාරී කාර්යාලය,
මහා රෝහල, කොළඹ.

## උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. ශ. | 3<br>ඇප මුදල<br>රු. ශ. | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| පිළිකායතනය, මහරගම : | | | | | |
| I වැනි කොටස ... ... | 100 0 ... | 400 0 ... | 4 ... | 5,400 | 65.9.7 පෙ.ව. 10 |
| II වැනි කොටස ... ... | 100 0 ... | 320 0 ... | 8 ... | 1,500 | |

8–969—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එෆ්.ටී.බී. 39/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### එක්ස්රේ. ෆ්‍රො. ටින්ක්ට්. කාර්ඩ් කො. ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උපලෙඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට එක්ස්රේ. ෆ්‍රො. ටින්ක්ට්. කාර්ඩ් කො. ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965.11.30 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ, අංක 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1965.11.29 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපතිතැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමු වෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ "එක්ස්රේ. ෆ්‍රො ටින්ක්ට් කාර්ඩ් කො. ආදිය—1965.11.30 උදේ 10" ට යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ කළ හැක. එසේහත් ටෙන්ඩර්කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහත කී නිලධාරිතැනට බලය ඇත. සීල් තබන ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එසේහත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

4. සැපයිය යුතු වියලි කිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මෙ සමග ඇති උපලේඛනයේ තෙවන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " මාතර සෞඛ්‍ය සේවා අධිකාරී " කියා එවිය යුතුය. සීල් කරනු ලද ටෙන්ඩර් බහා එවන ලද කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම, එහි වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම් කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරීට දීමෙන් එය ලැබුණ බවට ඔහු විසින් නිකුත් කරන ලද කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ සිව්වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් එම සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළිියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරන ලද ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතු වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා දෙවන ඡේදයේ සඳහන් කුමන කාර්‍යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පිළිවන.

එච්. සී. ගෝමස්,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 අගෝස්තු මස 20 වැනිදා,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

උපලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>දෙමසකට වතාවක් සැපයිය යුතු<br>වි. කිරි<br>හො. | <br><br>සීනි<br>හො. | 4<br>අවසාන දිනය |
|---|---|---|---|---|
| තංගල්ල බාහිර දුම්රිය බඩු ගබඩාවේ සිට වියලි කිරිත්, බටහිර ගිරුවා පත්තුවේ විවිධ සේවා සමුපකාර සංගමයේ සිට සීනිත්, තංගල්ලේ සෞඛ්‍ය කාර්‍යාලය ටත්, එහි සිට සෞඛ්‍ය කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථානවලටත් ... | තංගල්ල ... ... | 17 ... | 6 ... | 65. 9.17 |
| බෙලිඅත්ත බාහිර දුම්රිය බඩු ගබඩාවේ සිට වියලි කිරිත්, කන්දබඩ පත්තු විවිධ සේවා සමුපකාර සංගමයේ සිට සීනිත්, හක්මන සෞඛ්‍ය කාර්‍යාලයටත්, එහි සිට හක්මන හා වලස්මුල්ල කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථානවලටත් ... | හක්මන හා වලස්මුල්ල ... | 24 ... | 9 ... | 65. 9.17 |
| මාතර දුම්රිය පලේ සිට වියලි කිරිත්, වැලිගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සංගමයේ අකුරැස්ස ශාඛාවේ සිට සීනිත්, කොටපොල, අකුරැස්ස හා කඹුරු පිටිය සෞඛ්‍ය කොට්ඨාශවල පිහිටි කිරි මධ්‍යස්ථානවලටත් ... | අකුරැස්ස, කොටපොල, කඹුරුපිටිය | 17 ... | 6 ... | 65. 9.17 |

(කිරි මධ්‍යස්ථානවල තිබෙන බඩු බාහිරාදිය සෞඛ්‍ය කාර්‍යාලවලට ගෙන ඒමත්, සෞඛ්‍ය කාර්‍යාලවලින් දෙනු ලබන බඩු බාහිරාදිය කිරිමධ්‍යස්ථාන කරා ගෙන යාමත් ඉහත කී කොන්ත්‍රාත්කරුවන් විසින් ම කළ යුතුය. ඒ සඳහා මෙයට අමුතුවෙන් ගාස්තුවක ගෙවනු නොලැබේ.)

8-976—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පුත්තලම ලය රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1965.9.21 වැනි කුජදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 තේ පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1965.9.10 වැනි සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ " ඊ " කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ, ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැනට භාර දිය හැකිය. සේවයේ විස්තරද ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ වැඩිමනත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඇස්. ඊ. ජේ. මෙතර්,
වැ. බ. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

තැ. පෙ. 1434, කොළඹ 7,
1965.8.18 වෙනිදා.

8-895—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් තලංගම මධ්‍යම බෙහෙත්හලට වාට්ටුවක් සහ මුල්තැන් ගෙයක් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1965.9.28 වැනි කුජදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7හි පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1965.9.10 වැනි සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන පල්දෝරු හා ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ " බී " කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ, ගාළු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ අංක 155 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට භාර දිය හැකිය. සේවයේ විස්තරද, ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඇස්. ඊ. ජේ. මේනර්,
වැඩ බලන ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

තැ. පෙ. 1434, කොළඹ 7,
1965.8.18 වෙනිදා.

8–937—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපර්තමේන්තුව

### අයිතිකම් නොකියන ලද මෘතශරීර අස්කිරීම හා වැළලීම—රත්නපුර මහ රෝහල

වර්ෂ 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වැනි ද දක්වා (දින දෙකම ඇතුළුව) කාලපරිච්ඡෙදය තුල මේ සමග ඇති උපලේඛනයේ පළවැනි තීරයෙහි දක්වා ඇති පරිදි රත්නපුර, රෝහලෙහි අයිතිකම් නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම සඳහා එවනු ලැබූ සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුය.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙ.ව.10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකි ය. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

4. මේ සමග ඇති උපලේඛනයේ 2 වැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට කච්චේරියක මුදල් තැන්පත් කල බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පළමුව ඉදිරිපත් කල යුතුය.

අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකි ය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කල යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන අවසාන දින දවල් 12ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කල කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකි ය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් හෝ දිවයිනේ අනිකුත් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලවලින් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරභාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ ව තීරණයක් කල නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කල යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම, රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා යන්න සඳහන් කල යුතුය. ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියටම දැමීමෙන් හෝ කොන්ත්‍රාත්තු පිළිබඳ ගණකාධි වරයාට පුද්ගලිකව භාරදී හෝ ලැබුණු බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් එවීමට පිළිවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙ.ව. 10ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතුද වන්නේ ය.

9. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාරගැනීම ද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුව ඇත.

10. වැඩි විස්තර මෙ කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දැනගත හැකි ය.

දෙස්තර ඊ. ෂන්මුගනාදන්,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි වෙනුවට.

1965.8.21 වැනි දින, රත්නපුර,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| සේවය | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | | ඇප මුදල රු. | | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| අයිතිකම් නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම—රත්නපුර මහ රෝහල | ... | 100 | ... | 150 | ... | 1965.9.14 පෙ.ව. 10ට |

8–934—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අනුරාධපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් 1 වනදා සිට 1966 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය මේ ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (i) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුලු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අපේක්ෂා කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළෙඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ!

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් වන කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු මෙහි පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහිපිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නේ එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ජී. ඊ. ගජනායක,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අනුරාධපුරය, 19.8.65.

### උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් තැන්පත් | ඇප තැන්පත් | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන: සේවකයන් සඳහා: අළුත් මාළු | සේවකයන් සඳහා: හරක් මස් | සේවකයන් සඳහා: කරවල | සේවකයන් සඳහා: එළවළු | ලෙඩුන් සඳහා: අළුත් මාළු | ලෙඩුන් සඳහා: හරක් මස් | ලෙඩුන් සඳහා: කරවල | ලෙඩුන් සඳහා: එලවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | | | | | | | | | |
| 1. | නෙලුබැව ග්‍රා. රෝ. ... | 100 ... | 600 | 17.9.65 උදේ 10.ට | 300... | 300... | 300... | 1,250... | 700... | 700... | 600... | 2,700 |

8—946—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 21 වැනි අඟහරුවාදා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර වවුනියා අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. ව/මුලියවලෙයි ර. දෙ. මි. පාසැල | කැඩී ඇති පාසැල් ගොඩනැගිල්ල නැවත ගොඩනැංවීම. |
| 2. ව/වෙල්ලමුලිවයික්කාල් ර. දෙ. මි. පාසැල ... | කැඩී ඇති පාසැල් ගොඩනැගිල්ල නැවත ගොඩනැංවීම |

**සංලක්ෂ්‍යය :—**

**සටහන :** ව = වවුනියාව.

**සටහන :** කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කිරීම අවශ්‍යය.

| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | අනුමත සමිති |
|---|---|
| අංක 1—රුපියල් 15,000 වැඩි | රුපියල් 15,000 ට වැඩි |
| අංක 2—රුපියල් 6,000ට වැඩි | රුපියල් 6,000 ට වැඩි |

**2.** කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ රුපියල් 100ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් වවුනියාවේ අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉහතකී සටහන 2 සඳහන් මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට 1965 සැප්තැම්බර් මස 20 වැනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල්, ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ පාසැල් ගොඩනැගිලි අංශයෙන්, හෝ වවුනියා අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ ලබාගත යුතුය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුයි.

3. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ නියමිත වශයෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචි වී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලටද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී ෆෝරමයේ ලියා ඉල්ලුම් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකිවූද, ඔවුන්ගේ කාර්යාලයේදී සැලැස්ම බලාගත හැකි වූද වවුනියා අධ්‍යාපන නිලධාරින්ගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2 කින් යුක්තව ලියා පදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර වවුනියා අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියා පදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම ලිපිනය කවරයේ දැක්වෙන සේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයෙකු විසින් හෝ වවුනියා අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාරතුමා වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට එතුමා ගෙන් ටෙන්ඩරය භාර දුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 සැප්තැම්බර් මස 21 වැනි අඟහරුවාදා පෙරවරු 10.30 ට වවුනියා අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරි විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් දින සිට සති 6ක කාල පරිච්ඡේදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිළ ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීම පිණිස වවුනියා අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යාපන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

8. උළු සෙවිලි කළ යුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැන ගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමෙන් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකිවේ.

වෙ. ඈ. ඥනසේගරම්,
අධ්‍යාපන නිලධාරි තැන, වවුනියාව.

අධ්‍යාපන කාර්යාලය, වවුනියාව,
1965 අගෝස්තු මස 21 වැනි දින.

8–955—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නියෝජ්‍ය ආහාර පාලකතුමාගේ සැපයීම් මධ්‍යස්ථානවල සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසැල් වලට ඇදිහැස කිරි පිටි කාටන්ස් රාත්තල් 54 හෝ 100 ගෙනයාම, 1965-66**

කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් සේවාවන් සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුතු ටෙන්ඩර් සැප්තැම්බර් මාසයේ 17 වෙනි දින උදේ 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් මේ සඳහා නියමිත ෆෝරම කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගෙන පහත දැක්වෙන එක් එක් සැපයීම් මධ්‍යස්ථානයන් වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී රාත්තල් 54 කිරි පෙට්ටියක් දුරප්‍රමාණය ගැන නොසලකා පාසැල දක්වා ගෙනගොස් පාසැල් ප්‍රධානියාට භාරදීමට අයකරන ගාස්තුව දැක්විය යුතුය. නමුත් යම් හෙයකින් රාත්තල් 100 කිරි පිටි පෙට්ටියක් ප්‍රවාහණය කිරීමට සිදුවුවහොත් ඒ සඳහා අය කරන වැඩිපුර ගාස්තුව සඳහන් කළ යුතුය. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් කළයුතුව ඇත්තේ සැපයීමේ මධ්‍යස්ථානයේ සිට කිරිපිටි ගෙනගොස් නියමිත පාසැල් ප්‍රධානියාට භාරදීමයි. පාසැලකින් තවත් පාසැලකට කිරිපිටි ගෙනයාම හෝ නරක්වූ කිරිපිටි පාසැලේ සිට සැපයීමේ ස්ථානය වෙත ගෙනඒමද කළයුතුය. උප අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් නිකුත්කිරීමේ කුවිතාන්සි ලැබී දින 7ක් ඇතුළත කිරිපිටි ගෙනගොස් භාරදීම ඇරඹීමටද එය පටන්ගෙන දින 14 ක් ඇතුලත කිරිපිටි ගෙනගොස් භාරදීම නිම කිරීමටද කටයුතු කළ යුතුය.

3. 1965 සැප්තැම්බර් 16 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයට පැමිණ ලබාගත හැක. භාරගන්නා ලද ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 17 වෙනි දින උදේ 10.30 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ටත් මෙහි පැමිණ සිටීමට අවසර ඇත.

4. මේ සේවය සඳහා පිළිගත් සමූපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති හෝ කම්කරු සමූපකාර සමිති ඉදිරිපත් වන්නේ නම් මෙම වැඩය භාරගෙන කළහැකි බවට පිළිවෙලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගෙන් හෝ ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් ෆෝරම නිකුත්කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවළුන් විසින් කෑගල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ඉල්ලුම්කරුට අයත් රුපියල් 15,000ක් (පහළොස් දාහක්) වටිනා නිශ්චල දේපොල ඇති බව ඒත්තු යන අන්දමට හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරන ලද ආදායම් වර්ෂයට බලපත්‍ර ලබාගත් එක් ලොරියක් වත් අයිතිව තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. මධ්‍යස්ථාන දෙකකට වඩා ඉල්ලුම් කරන අපේක්ෂකයින් ඔවුන්ට අඩුගණනේ ලොරි දෙකක්වත් තිබෙන බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර් සඳහා රුපියල් 100 ක මුදලක් කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ හෝ කච්චේරියේ තැන්පත් කර එම රිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම දෙනු ලැබේ.

7. මේ පිළිබඳ තවදුරටත් විස්තර සතියේ වැඩ කරන දින වල රාජකාරි කාලය තුළදී කෑගල්ල අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැක.

**සැපයීමේ මධ්‍යස්ථාන :—කෑගල්ල, වරකාපොල, සහ කරවනැල්ල.**

වී. ජී. බී. මුණසිංහ,
කෑගල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 20 වෙනි දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී ය.

8–795/1—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### නියෝජ්‍ය ආහාර පාලකතුමාගේ සැපයීම මධ්‍යසථානවල සිට කෑගළු දිස්ත්‍රික්කයේ අවසරලත් බේකරිවලට ඇදිහැස පිටි මිටි රාත්තල් 50 හෝ 150 ගෙනයාම, 1965-66

කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් සේවාවන් සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුතු ටෙන්ඩර් සැප්තැම්බර් මාසයේ 17 වෙනි දින උදේ 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් මේ සඳහා නියමිත පෝරම කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගෙන පහත දැක්වෙන එක් එක් සැපයීම් මධ්‍යස්ථානයන් වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී රාත්තල් 50 පිටි මිටියක් දුරප්‍රමාණය ගැන නොසලකා බේකරිය දක්වා ගෙනගොස් බේකරි හිමියාට භාරදීමට අයකරන ගාස්තුව දැන් විය යුතුය. නමුත් යම් හෙයකින් රාත්තල් 150 පිටි මිටියක් ප්‍රවාහණය කිරීමට සිදුවුවහොත් ඒ සඳහා අය කරන වැඩිපුර ගාස්තුව සඳහන් කළයුතුය. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් කළ යුතුව ඇත්තේ සැපයීමේ මධ්‍යසථානයේ සිට පිටි ගෙනගොස් නියමිත බේකරි හිමියාට භාරදීමයි. බේකරියකින් තවත් බේකරියකට පිටි ගෙනයාම හෝ නරක් වූ පිටි බේකරියේ සිට සැපයීමේ සථානය වෙත ගෙනඒමද කළයුතුය. උප අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් නිකුත් කිරීමේ කුවිතාන්සි ලැබී දින 7ක් ඇතුළත පිටි ගෙනගොස් භාරදීම ඇරඹීමටද එය පටන්ගෙන දින 14 ක් ඇතුලත පිටි ගෙනගොස් භාරදීම නිමකිරීමටද කටයුතු කළ යුතුය.

3. 1965 සැප්තැම්බර් 16 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයට පැමිණ ලබාගත හැක. භාර ගන්නා ලද ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 17 වෙනි දින උදේ 10.30 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ටත් මෙහි පැමිණ සිටීමට අවසර ඇත.

4. මේ සේවය සඳහා පිළිගත් සමූපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති හෝ කම්කරු සමූපකාර සමිති ඉදිරිපත් වන්නේ නම් මෙම වැඩය භාරගෙන කළහැකි බවට පිළිවෙලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්තුමාගෙන් හෝ ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පෝරම නිකුත්කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් කෑගල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ඉල්ලුම්කරුට අයත් රුපියල් 15,000ක් (පහළොස්දාහක්) වටිනා නිශ්චල දේපොල ඇති බව ඒත්තු යන අන්දමට හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරනලද ආදායම් වර්ෂයට බලපත්‍ර ලබාගත් එක් **ලොරියක් වත්** අයිතිව තිබෙන බවට පිළිගතහැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. මධ්‍යස්ථාන දෙකකට වඩා ඉල්ලුම්කරන අපේක්ෂකයින් ඔවුන්ට අඩුගණනේ ලොරි දෙකක්වත් තිබෙන බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් සඳහා රුපියල් 100ක මුදලක් කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ හෝ කච්චේරියේ තැන්පත් කර එම රිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ.

7. මේ පිළිබඳව තවදුරටත් විස්තර සතියේ වැඩ කරන දින වල රාජකාරි කාළය තුලදී කෑගල්ල අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැක.

**සැපයීමේ මධ්‍යස්ථාන :—** කෑගල්ල, වරකාපොල, සහ කරවනැල්ල.

වී. ජී. බී. මුණසිංහ,
කෑගල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 20 වෙනි දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී ය.

8–795/2—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

### නියෝජ්‍ය ආහාර පාලකතුමාගේ බදුල්ල, බණ්ඩාරවෙල සහ හපුතලේ සැපයීමේ මධ්‍යසථානවල සිට බදුල්ල, බණ්ඩාරවෙල, හපුතලේ සහ මොණරාගල යන ප්‍රදේශවල පාසල්වලට රාත්තල් 60 ඇදිහැස කිරිපිටි ගෙන යැම—1965-66

ඉහත සඳහන් සේවය සඳහා සීල් තබන ලද්දා වූ පිටපත් දෙකකින් යුක්ත ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් 1965 සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. 10.30 දක්වා භාර ගනු ලැබේ.

2. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයෙන් මේ සඳහා ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් කළයුතුව ඇත්තේ සැපයීමේ මධ්‍යසථානවල සිට ඇදිහැස කිරිපිටි ගෙන ගොස් බදුල්ල, බණ්ඩාරවෙල, හපුතලේ සහ මොණරාගල යන ප්‍රදේශවල පිහිටි පාසල් ප්‍රධානීන් වෙත භාරදීමයි. සාමාන්‍යයෙන් පසැල් වාරයකට එක් වරක් බැගින් පාසල් ප්‍රධානීන් වෙත කිරිපිටි ගෙන යා යුතුයි. ඇදිහැස සංවිධානයෙන් නිකුත් කිරීමේ බලපත්‍ර ලැබී සති දෙකක් ඇතුළත පාසල් ප්‍රධානීන් වෙත කිරිපිටි භාර දිය යුතුය. මෙම සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේ දී රාත්තල් 54 රේ හෝ රාත්තල් 100යේ පෙට්ටිවල අසුරන ලද කිරිපිටි හොණ්ඩර එකක් පහත දැක්වෙන සැපයීමේ මධ්‍යස්ථානයේ සිට එහි දැක්වෙන ප්‍රදේශයේ ඕනෑම පාසලකට ප්‍රවාහනය කිරීම සඳහා (දුර ප්‍රමාණය නොතකා) පොදු ගාස්තුවක් මූල්කොට ගතයුතුය :—

| සැපයීමේ මධ්‍යසථානය | ප්‍රවාහණය කළයුතු ප්‍රදේශය |
|---|---|
| (1) බදුල්ල | බදුල්ල |
| (2) බදුල්ල | මොණරාගල |
| (3) බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල |
| (4) හපුතලේ | හපුතලේ |

3. පිළිගත් සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමූපකාර සමිති මෙම වැඩය භාරගෙන කළහැකි බවට පිළිවෙලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ ලබගත් සහතිකයක් බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කළයුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12 දක්වා ලබා ගතහැකිය. ලැබුණු ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 13 වැනි සඳුදා පෙ. ව. 10.30 ට බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට ඉඩදෙනු ඇත. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ තමාට රුපියල් 15,000ක වටිනාකමක් ඇති නිශ්චල දේපළක් ඇති බවට ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරීතුමාගෙන් ලබාගත් සහතිකයක් හා අඩු වශයෙන් තමා නමට ලියාපදිංචි කළ එක් ලොරියක්වත් ඇති බවට සහතිකයක් මෙම වර්ෂයට ලබාගත් බලපත්‍රයත් සමග ඉදිරිපත් කරන අයට පමණි.

5. ටෙන්ඩරයක් සම්පූර්ණ වශයෙන් හෝ ටෙන්ඩරයකින් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයාට බලය තිබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසාන වශයෙන් භාරගන්නා ලද දින සිට සති ෂයක් ගතවන තුරු ටෙන්ඩර්කරුවන් විසින් ස්වකීය ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබිය යුතුය.

7. මේ පිළිබඳ තවදුරටත් විස්තර හා තොරතුරු බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයෙන් ලබා ගත හැකිය.

බී. පී. එම්. සේනානායක,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ඌව ප්‍රදේශය).

1965 අගෝස්තු මස 18 වැනි දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයේ දීය.

8–727/1—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

### නියෝජ්‍ය ආහාර පාලක තුමාගේ සැපයීමේ මධ්‍යසථානවල සිට පහත විස්තර දැක්වෙන ප්‍රදේශවල පාසල්වලට බණිස් සපයන බේකරි හිමියන් වෙත ඇදිහැස පිටි (රු. 50 හෝ රු. 150 මිටිවලින්) ගෙන යැම—1965-66

බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ඉහත සඳහන් සේවය සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. 10.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී රාත්තල් 50හේ මිටියක් සහ රාත්තල් 150හේ මිටියක් සැතපුමක් ගෙනයාමට අය කරනු ලබන ගාස්තුව මූල්කොට වෙන වෙනම රේට් ගණන් ඉදිරිපත් කළයුතුය. පහත සඳහන් එක් එක් මධ්‍යස්ථාන වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර්පත් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර්කරුවන් විසින් කළ යුතුව ඇත්තේ පහත දැක්වෙන නියෝජ්‍ය ආහාර පාලක තුමාගේ සැපයීමේ මධ්‍යස්ථානවල සිට එම පළාත්වල පිහිටි පාසල්

වලට බනිස් සපයන බේකරි හිමියන් වෙත යටත් පිරිසෙයින් පාසල් වාරයකට දෙවරක් බැගින් ඇදිහැස පිටි ගෙන ගොස් භාර දීමය :—

| සැපයීමේ මධ්‍යස්ථානය | ප්‍රවාහන කළයුතු ප්‍රදේශය |
|---|---|
| (1) බදුල්ල | බදුල්ල |
| (2) බදුල්ල | මොණරාගල |
| (3) බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල |
| (4) හපුතලේ | හපුතලේ |

2. ඇදිහැස සංවිධානයෙන් නිකුත් කිරීමේ බලපත්‍ර ලැබී සති 2ක් ඇතුළත බේකරි හිමියන් වෙත පිටි ගෙන යා යුතුය.

3. පිළිගත් සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමුපකාර සමිති මෙම වැඩය භාරගෙන කළහැකි බවට පිළිවෙලින් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ ලබගත් සහතිකයක් බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කළයුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12 වනතෙක් ලබා ගතහැකිය. ලැබුණු ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 13 වැනි සඳුදා පෙ. ව. 10.30ට බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ තමාට රුපියල් 15,000ක වටිනාකමක් ඇති නිශ්චල දේපළක් ඇති බවට ප්‍රදේශයයේ ආදායම් පාලක නිලධාරිතුමාගෙන් ලබාගත් සහතිකයක් හා අඩු වශයෙන් තමා නමට ලියාපදිංචි කළ එක් ලොරියක්වත් ඇති බවට සහතිකයක් මෙම වර්ෂයට ලබාගත් බලපත්‍රයත් සමග ඉදිරිපත් කරන අයට පමණී.

5. ටෙන්ඩරයක් සම්පූර්ණ වශයෙන් හෝ ටෙන්ඩරයකින් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට බලය තිබේ.

6. මේ පිළිබඳව වැඩිදුරටත් ඇති කොන්දේසි ආදී සම්පූර්ණ විස්තරයක් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයෙන් ලබා ගත හැක.

බී. පී. එම්. සේනානායක,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ඌව ප්‍රදේශය).

1965 අගෝස්තු මස 18 වැනි දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයේ දීය.

8–727/2—65.8.27 දින අංක 14,490 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 සැප්තැම්බර් මස 9 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, කුරුණෑගල, අධ්‍යාපන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. කු/හීනුග්ගල විද්‍යාලය ... | වහල අළුත්වැඩියාව. |
| 2. කු/දඹදෙනිය ගුරු විද්‍යාලය | කසළ ටැංකි. |
| 3. කු/ගොකරැල්ල ප්‍රාථමික විද්‍යාලය ... | වහල අළුත්වැඩියාව. |
